වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2020
வருடாந்த செயற்திறன் அறிக்கை - 2020
Annual Performance Report - 2020

කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
Department of Labour

2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

කම්කරු දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංක 221

පෙළගැස්ම

පිටුව

පළමු පරිච්ඡේදය : ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය **01**

1.1. හැඳින්වීම 02
1.2. දැක්ම, මෙහෙවර සහ අරමුණු 02
1.3. ප්‍රධාන කාර්යයන් 03
1.4. සංවිධාන සටහන 04
1.5. දෙපාර්තමේන්තුවේ අංශ 05
1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 15

දෙවන පරිච්ඡේදය : ප්‍රගතිය හා ඉදිරි දැක්ම **16**

2.1. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම 17
2.2. විශේෂ විමර්ෂණ 22
2.3. ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය කිරීම 23
2.4. සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව සඳහා සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම 24
2.5. ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම 27
2.6. සේවකයන්ගේ සමාජ ආරක්ෂණය 30
2.7. සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය 33
2.8. පරිපාලනය 35
2.9. මූල්‍ය කළමනාකරණය 37
2.10. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් වෙත මෙහෙයවීම හා මානව සම්පත් සංවර්ධනය 38
2.11. සංඛ්‍යා ලේඛන කටයුතු 43
2.12. සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම 45
2.13. අභ්‍යන්තර විගණනය 47
2.14. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 47

තුන්වන පරිච්ඡේදය : 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය **52**

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 53

3.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 55

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 57

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 60

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 61

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 61

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 62

3.8 මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 63

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 64

සිව්වන පරිච්ඡේදය : කාර්යසාධන දර්ශක **73**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 74

පස්වන පරිච්ඡේදය : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **75**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 76

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 80

සයවන පරිච්ඡේදය : මානව සම්පත් පැතිකඩ **81**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 82

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 82

6.3 මානව සම්පත් සංවර්ධනය 83

සත්වන පරිච්ඡේදය : අනුකූලතා වාර්තාව **87**

ප්‍රස්ථාර

ප්‍රස්තාරය 2.1 - කාලීන පරීක්ෂණ - 2019 වර්ෂයේ ප්‍රගතියට සාපේක්ෂව 2020 වර්ෂයේ ප්‍රගතිය 19

ප්‍රස්ථාරය 2.2 - 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් 20

ප්‍රස්තාරය 2.3 - සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම -2020 22

ප්‍රස්ථාරය 2.4 - ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම් - 2020 32

ප්‍රස්ථාරය 2.5 - සියලුම දිස්ත්‍රික් කාර්යාල මගින් පවරන ලද සහ විසඳී ඇති නඩු - 2020 34

ප්‍රස්තාරය 2.6 - පසුගිය වර්ෂ පහ තුල සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව 40

ප්‍රස්තාරය 2.7 - කම්කරු පරීක්ෂණයන්හි ගුණාත්මක භාවය - 2018, 2019 සහ 2020 වර්ෂ 40

ප්‍රස්තාරය 2.8 - සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම සඳහා ගතවූ කාලය - 2017, 2018, 2019 සහ 2020 වර්ෂ 41

වගු

වගුව 2.1 - මානව සම්පත් සංවර්ධන අංශය විසින් සිදු කරනු ලැබූ කාර්යයන් - 2019 17

වගුව 2.2 - 2020 වර්ෂය තුල කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලද පැමිණිලි සංඛ්‍යාව 20

වගුව 2.3 - වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2019 වසරට සාපේක්ෂව 2020 වර්ෂය 21

වගුව 2.4 - ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් - 2020 23

වගුව 2.5 - සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් - 2020 24

වගුව 2.6 - වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ඉහළ නැංවීම් සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩමුළු-2020 26

වගුව 2.7 - රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම- 2020 28

වගුව 2.8 - අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය ප්‍රගතිය - 2020 32

වගුව 2.9 - අධිකරණ අනුව නඩුවල කාර්ය සාධනය - 2020 34

වගුව 2.10 - දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2020 37

වගුව 2.11 - දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් 2020 42

වගුව 2.12 - බාහිර පුහුණු ආයතනයන්හි පුහුණු සඳහා දෙපාර්තමේන්තු නිලධරයන් වෙත ප්‍රතිපාදන ලබා දීම - 2020 43

වගුව 2.13 - ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2020.12.31 දිනට සමස්ත වියදම- 2020 43

වගුව 2. 14 - සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය - 2020 44

වගුව 2.15 - වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2020 46

වගුව 2.16 - දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2020 84

ඡායාරූප

ඡායාරූපය 2.1 - සමාජ කතිකා අංශයෙන් සිදුකළ සේවා සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහනක් 18

ඡායාරූපය 2.2 - සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලියේ සම්මාන ප්‍රදානෝත්සවය 2019 18

ඡායාරූපය 2.3 - ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම 2020 29

පළමු පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයන්ගේ වෘත්තීය හිමිකම් තහවුරු කිරීම හා සමාජ ආරක්ෂණය ඇති කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වේ. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් කම්කරු විෂයට අදාල අණ පනත් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය ප්‍රවර්ධනය කිරීම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්තව කම්කරු කාර්යාල පවත්වා ගනිමින් පැවරී ඇති වගකීම ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යය සතු යටත් විජිතයක්ව පැවති සමයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ව්‍යාපාරික වතු වගාව යටතේ කෝපි හා තේ වගාව සඳහා මෙරටට ගෙන්වන ලද ඉන්දීය කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් 1923 අංක 01 දරන ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනත හඳුන්වා දෙන ලදී. එම ආඥා පනත යටතේ පිහිටුවන ලද ඉන්දියානු ආගාමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුව කම්කරු දෙපාර්තමේන්තුවේ මූලාරම්භය වේ. වර්තමානයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේව්‍ය සේවක හා රජය යන ත්‍රෛපාර්ශවීය සම්බන්ධතාවය ශක්තිමත්ව පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යභාරය ඉටු කරයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

''අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක්''

1.2.2 මෙහෙවර

''කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුලින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම''

1.2.3 අරමුණු

- පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා ආයතන තුල ස්ථිරසාර කාර්මික සාමය තහවුරු කිරීම
- සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම හා ශ්‍රම ප්‍රමිතීන් සකස් කිරීම මගින් සේවකයන්ගේ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම
- සේවකයන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම
- ස්ත්‍රීන් හා තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ළමා ශ්‍රමය තුරන් කිරීම
- සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- ආයතන වල සේවකයන් හා සේවායෝජකයන් අතර කතිකාවත ප්‍රවර්ධනය කිරීම
- කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මගින් කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම හා ඇතිවූ ආරවුල් නිරවුල් කිරීම
- ඵලදායීව කාලීන පරීක්ෂණ සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධරයන්ට ඇවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මගින් සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම.
- සේව්‍ය සේවක දෙපාර්ශවය තුල කම්කරු නීති පිළිබඳව පවතින දැනුම හා අවබෝධය පුළුල් කිරීම තුලින් කාර්මික සාමය තහවුරු කිරීම.
- ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම.
- සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය.
- කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුලු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම
- වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම.
- ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය.
- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම.
- ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම.

1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම දෙපාර්තමේන්තුවෙහි දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ. මේ සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, සේවා ස්ථාන පරීක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, වැඩ බිම තුළ අනතුරු රහිත බව තහවුරු කිරීම, සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව පහත අංශ ක්‍රියාත්මකවේ.

1.5.1. කාර්මික සම්බන්ධතා අංශය
1.5.2. මානව සම්පත් සංවර්ධන අංශය
1.5.3. විශේෂ විමර්ශන අංශය
1.5.4. ශ්‍රම ප්‍රමිති අංශය
1.5.5. කර්මාන්තමය සුරක්ෂිතතා අංශය
1.5.6. වෘත්තීය ස්වස්ථතා අංශය
1.5.7. කාන්තා හා ළමා කටයුතු අංශය
1.5.8. සේවක අර්ථසාධක අරමුදල් අංශය
1.5.9. නීති ක්‍රියා අංශය
1.5.10. පාලන අංශය
1.5.11. මුදල් අංශය
1.5.12. සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය
1.5.13. සංඛ්‍යාලේඛන අංශය
1.5.14. අභ්‍යන්තර විගණන අංශය

එසේම, දිවයින පුරා විසිරී සිටින කම්කරු ප්‍රජාව වෙත අපේක්ෂිත සේවා පහසුකම් සැලසීමේ අරමුණින් කලාප කම්කරු කාර්යාල 11ක් ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක් ද, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ද කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ, දිවයින පුරා පිහිටුවා සේවා සපයනු ලැබේ.

ඉහත සඳහන් එක් එක් අංශයන්හි කාර්යභාරය පහත පරිදි වේ.

1.5.1 කාර්මික සම්බන්ධතා අංශය

සේවක අයිතීන් ආරක්ෂා කරමින් රට තුළ කාර්මික සාමය ඇතිකර රටේ ආර්ථික වර්ධනයට සහ සංවර්ධනයට දායක වීමේ වගකීම කාර්මික සම්බන්ධතා අංශය මගින් දරනු ලබයි. මේ සඳහා කාර්මික සම්බන්ධතා අංශය යටතේ සේවය අවසන් කිරීමේ අංශය සහ වෘත්තීය සමිති අංශය ක්‍රියාත්මක වන අතර කාර්මික අධිකරණයේ සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරනු ලබයි.

ඒ අනුව, ආර්ථික ඵලදායීතාවය නංවාලීම සඳහා අවශ්‍ය කාර්මික සාමය ඇති කිරීම, කම්කරු අණ පනත් වලින් නියමකර ඇති සේවා කොන්දේසි හා සේවා තත්ත්වයන් ආරක්ෂා කිරීම, සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම හා එය ප්‍රවර්ධනය කිරීම, වැඩ වර්ජන හා කාර්මික ආරවුල් අවම කිරීම සහ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ නියාමනය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණු වේ.

මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කෙරනු ලැබේ

- 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
- 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
- 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත

1.5.2 මානව සම්පත් සංවර්ධන අංශය

දිවයින පුරා විසිරී ඇති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම මානව සම්පත් සංවර්ධන අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව එම අංශය විසින් පහත කටයුතු සිදු කරනු ලබයි.

1.5.2.1 සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති හා උපාය මාර්ග හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික මට්ටමෙන් වැඩපොළ සහයෝගීතාව ගොඩනැගීම

1.5.2.2 සාමූහික ගිවිසුම් ඇති කිරීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කරමින් කාර්මික සාමය ගොඩනැගීම

1.5.2.3 යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතන දැනුවත් කිරීමේ වැඩ සටහන් තුළින් සේව්‍ය සේවක දෙපාර්ශවය කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම (මේ සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් සහ කළමනාකරුවන් හා සේවායෝජකයින් සඳහා වන වැඩසටහන් සංවිධානය කොට පවත්වනු ලබයි.)

1.5.2.4 සේවා සේවක දෙපාර්ශවය හා නියෝජ්‍ය / සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය කම්කරු කාර්යාල හරහා කම්කරු දෙපාර්තමේන්තුවේ ත්‍රෛපාර්ශවීය සබඳතාවය ගොඩනැගීම සහ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට කලාප / දිස්ත්‍රික් කම්කරු උපදේශන සභා පැවැත්වීම.

1.5.2.5 දැනුම බෙදා හදා ගැනීමටත් සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කම්කරු නීති, පිළිබඳව පවතින ගැටලු නිරාකරණය කිරීමටත් කලාප කතිකාවත පැවැත්වීම.

1.5.2.6 කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම සඳහා දැනුම වර්ධනය කිරීමට කතිකාව සහරාව එළි දැක්වීම.

1.5.2.7 සමාජ කතිකාව කොතරම් දුරට ආයතන තුළ තහවුරු වී තිබේද යන්න පිළිබඳව වාර්ෂිකව නිෂ්පාදන, සේවා, ඇඟළුම් හා වැවිලි අංශය නියෝජනය වන පරිදි කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් දීප ව්‍යාප්තව සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගිතාවය පිළිබඳ තරඟාවලියක් පැවැත්වීමට කටයුතු කිරීම සහ ඊට සමගාමීව සමාජ කතිකාව සහ වැඩපොළ සහයෝගිතාවය පිළිබඳ ගද්‍ය රචනා හා පද්‍ය රචනා (සිංහල / දෙමළ), චිත්‍ර, පෝස්ටර් හා කෙටි වීඩියෝ නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම.

1.5.3 විශේෂ විමර්ශන අංශය

සාමාන්‍ය පරිදි සිදු කෙරෙන කම්කරු පරීක්ෂණ සහ පැමිණිලි පරීක්ෂණවලට අමතරව, යම් පැමිණිලි විමර්ශනයක් හෝ යම් ආයතනයක සිදු කරන ලද පරීක්ෂණයක් සිදුවූ ආකාරය පිළිබඳ සෑහීමට පත් නොවන අයකු විසින් ස්වාධීන පරීක්ෂණයක් නැවත ලබාගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි විශේෂ විමර්ශණ අංශය වෙත යොමු කරනු ලැබේ. කම්කරු කොමසාරිස් ජනරාල් ගේ නියෝග සහිතව ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක විමර්ශන කිරීමේ බලය මෙම අංශයට පවතී. එමෙන්ම හදිසි හා ක්ෂණික පරීක්ෂණ හා විශේෂ විමර්ශන රාජකාරී කටයුතු වල යෙදෙන හෙයින් මෙම අංශය දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයකි.

1.5.4 ශ්‍රම ප්‍රමිති අංශය

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාවලියකි. සේවා තත්ත්වයන් හා කොන්දේසිවලට අදාළව පැන නගින ගැටළු සහගත තත්ත්වයන් නිරාකරණය කරගැනීමෙහිලා ඊට අදාළ පැහැදිලි කිරීම් ලබා දීම ද ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමෙහිලා ඇති ප්‍රගතිය මෙන්ම අධීක්ෂණ කාර්යය ද ඉටු කිරීම මගින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීම මෙම කාර්යාවලියේ

අත්‍යවශ්‍ය කොටසක් වන අතර, මෙම සමස්ත වගකීම ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ ශ්‍රම ප්‍රමිති අංශය විසින් සිදු කරනු ලැබේ.

මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කෙරනු ලැබේ

- 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
- 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
- 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත
- 2016 අංක 03 දරන ජාතික අවම වේතන පනත
- 2016 අංක 04 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත

1.5.5 කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

කර්මාන්තශාලා තුල සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මගින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතී. එබැවින්, අනතුරු ඇති වීම අවම කිරීම **කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ** වගකීම වේ. ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනයට අදාල ප්‍රධානම නීතිමය මෙවලමක් වනුයේ වර්ෂ 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත හා එයට අනුකූලව සම්මත කර ඇති රෙගුලාසින්ය. උපද්‍රව රහිත සේවා පරිසරයක් ඇති කිරීම මගින් අනතුරු පිළිබඳ බියකින් තොර ආරක්ෂිත ශ්‍රම බලකායක් බිහි කිරීම මගින් සේවා ස්ථාන වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් එමගින් දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමත් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නැංවීමත් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 හි සේවයේ නියුතු ඉංජිනේරුවරු 31 දෙනා විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්ය ඉටු කරනු ලබන අතර, කම්කරු නිලධරයන් විසින් කරනු ලබන කම්කරු පරීක්ෂණ වලදී හඳුනා ගැනෙන අනතුරුදායක තත්ත්වයන් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙත වාර්තා කරනු ලබන හෙයින් එම තොරතුරුද භාවිත කොට සේවක ආරක්ෂාව සැලසීම කරනු ලබයි.

මූලික වශයෙන් කර්මාන්තමය සුරක්ෂිතතාව සැලසීම සඳහා පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

1.5.5.1 නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

1.5.5.2 ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා අනුමත කිරීම

1.5.5.3 කර්මාන්තශාලා පරීක්ෂා කිරීම

1.5.5.4 අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය

1.5.5.5 නීතිමය පියවර ගැනීම

1.5.5.6 අධිඅන්තරාදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම

1.5.5.7 පැමිණිලි විමර්ශනය

1.5.5.8 දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

1.5.5.9 වෘත්තීය අනතුරු හා ලෙඩ රෝග වලට ගොදුරු වන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම

1.5.5.10 වෙනත් වැඩසටහන්

1.5.5.11 කම්කරු දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කටයුතු ඉටු කිරීම

1.5.6 වෘත්තීය ස්වස්ථතා අංශය

බලපවත්නා කර්මාන්ත ශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂාවන පරිදි සේවාස්ථානයේ පරිසරය සැකසීම සේවායෝජකයාගේ අනිවාර්ය වගකීමක් වන අතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට ඇති හිමිකම සේවකයන්ගේ මූලික අයිතිවාසිකමක් වේ.

වෘත්තියෙහි නිරතවීමේදී සේවා පරිසරයේ දූර්වලතා මත ශ්‍රමිකයන් රෝග තත්ත්වයනට ගොදුරුවීමේ අවධානම හා හදිසි අනතුරුවලට ගොදුරු වීම අවම කිරීම මගින් වෘත්තිකයන්ට ලබා දිය හැකි ඉහළම කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික සුභ සාධනය සහිත පරිසරයක් සේවා පියස තුල ඇති කල යුතු වේ. ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන දැනුම ලබා දීම හා සේවා පියස තුල ඇති තත්ත්ව පරීක්ෂාවට ලක් කිරීම **වෘත්තීය ස්වස්ථතා අංශයේ** මෙහෙයුම් ක්‍රියාවලිය වේ.

මූලික වශයෙන්ම සේවා පරිසරයේ යම් දූර්වලතා මත ක්ෂණිකව හෝ දීර්ඝකාලීන වශයෙන් ශ්‍රමිකයන් සෞඛ්‍ය ගැටළුවලට මුහුණදීමට සිදුවිය හැකි තත්ත්වයන් පවතින්නේ ද යන්න විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයාබැලීම, එමගින් ඇති විය හැකි සෞඛ්‍ය ගැටලු ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රමාණනය කිරීම පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ සිදුකිරීම, එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම ප්‍රායෝගිකව සිදුකරනු ලැබේ.

මූලික වශයෙන් වෘත්තීය ස්වස්ථතා අංශය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

1.5.6.1 සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම

1.5.6.2 සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම

1.5.6.3 වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දීම

1.5.6.4 වෘත්තීය ස්වස්ථතා කරුණු මත වන්දි ඉල්ලුම් කරන අය පිළිබඳ, රෝගී තත්ත්වය ඇති වීම හා සේවා ස්ථානයේ තත්ත්වයන් පිළිබඳව අධිකරණයේදී සාක්ෂි ලබා දීම

1.5.6.5 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙතින් අරමුදල් අයදුම්කරන, සේවය කිරීමට නොහැකිවන පරිදි රෝගී තත්ත්වයනට පත්වූ සේවකයන්ගේ රෝග තත්ත්ව තක්සේරු කිරීම

1.5.7 කාන්තා හා ළමා කටයුතු අංශය

ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය තුල කාන්තා දායකත්වය ඉහළ නැංවීම හා ළමා ශ්‍රමය මුළුමනින් තුරන් කිරීම ශ්‍රී ලංකා රජයේ අත්‍යවශ්‍ය වගකීමක්ව පවතින අතර මෙම වගකීම කාන්තා හා ළමා කටයුතු අංශයේ කාර්යයන්හි මූලික දෙවැදෑරුම් වගකීම බවට පත්ව තිබේ.

ඒ අනුව, වැඩ බිමෙහි කාත්තාවන් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම මෙම අංශයේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය සහිතව ළමා ශ්‍රමය තුරන් කිරීම, වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීම, පවත්නා නීතිය සංශෝධනය කොට වර්තමාන සමාජ ගැටළු වලට අදාලව, පවත්නා නීතියෙහි කලයුතු සංශෝධනයන් නිර්දේශ කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

ඒ අනුව, අංශය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි

1.5.7.1 රැකියාවන්හි නිරත කාන්තාවන් හා තරුණ අය කෙරෙහි අදාල වන්නාවූ පනත්හි විධිවිධාන ක්‍රියාවට නැගීම හා ඒ සඳහා කලාප හා දිස්ත්‍රික් කම්කරු කාර්යාල මෙහෙයවීම

1.5.7.2 කාන්තාවන් හා ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව සිදු කිරීම

1.5.7.3 රැකියාවන්හි නියුතු කාන්තාවන්ට හා ළමුන්ට අදාලව පවත්නා නීතිය අධ්‍යයනය කොට දුර්වලතා හා ඌනතා හඳුනාගෙන නීතිය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

1.5.7.4 ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් වලින් පවත්වනු ලබන ළමා සංවර්ධන කමිටු වලදී සඵල දායකත්වයක් ලබා දීම

1.5.7.5 රැකියාවල නියුතු කාන්තාවන් සඳහා නිදහස් වෙළඳ කලාපයන්හි පිහිටුවා ඇති කම්කරු දෙපාර්තමේන්තුවට අයත් කාන්තා නේවාසිකාගාර නඩත්තු කිරීම

එසේම, මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කෙරනු ලැබේ.

- 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත
- 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත

1.5.8 සේවක අර්ථසාධක අරමුදල් අංශය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන ශ්‍රමිකයන් හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුමකර දීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය ශ්‍රී ලංකා මහබැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. වරින් වර සංශෝධනය වූ මෙම පනත යටතේ මේ වන විට ඉටුකරනු ලබන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

1.5.8.1 සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවායෝජකයින් ලියාපදිංචි කිරීම

1.5.8.2 සේවක අර්ථ සාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම

1.5.8.3 දායක මුදල් නොගෙවන සේවා දායකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම

1.5.8.4 සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම

1.5.8.5 සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයාගේ ගිණුම් ශේෂය මත පදනම්ව නිවාස ණය ලබා දීම

1.5.8.6 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

1.5.9 නීති ක්‍රියා අංශය

කම්කරු නීති දිවයින පුරා වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීම තුලින් කාර්මික සාමය තහවුරු කිරීමේ දැක්මෙන් යුතුව කම්කරු දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය ක්‍රියාත්මක වේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංගනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවා සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේවා සේවක සහයෝගීතාවය වර්ධනය කිරීමත් දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, නීති ක්‍රියා අංශයේ මූලික කාර්යයන් පහත පරිදි දැක්විය හැකිය.

1.5.9.1 ව්‍යවස්ථාපිත කම්කරු නීති උල්ලංගනය වීමකදී ඊට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට අදාල කාර්යයන් ඉටු කිරීම හා එම නඩු මෙහෙයවීම

1.5.9.2 වාණිජ මහාධිකරණයේ, පළාත්බද මහාධිකරණයේ, මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ කම්කරු දෙපාර්තමේන්තුවට එරෙහිව හෝ දෙපාර්තමේන්තුව විසින්

පවරනු ලබන නඩු වලදී එම නඩු පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගැනීම

1.5.9.3 කලාප කාර්යාල අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මගින් සිදු කරනු ලබන අධිකරණමය ක්‍රියාවන් අධීක්ෂණය කිරීම, අවශ්‍ය උපදෙස් ලබා දීම හා එම අධිකරණමය ක්‍රියාවන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීම

1.5.9.4 කලාපය තුල පවත්නා දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාලවල හා අධිකරණ ක්‍රියාමාර්ග වලට යොමු විය යුතු අවස්ථාවලදී හා අක්‍රීය නඩු සක්‍රීය කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය උපදෙස් ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවලදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් නඩු මෙහෙයවීම කලාප කාර්යාලවල සේවයේ නියුතු නීති නිලධරයන් ඉටු කරනු ලැබේ

1.5.10 පාලන අංශය

පාලන අංශය ශාඛා 04 කින් සමන්විත වේ. එනම්, පාලන ශාඛාව, ආයතන ශාඛාව, ගොඩනැගිලි නඩත්තු ඒකකය සහ පුස්තකාලය වේ.

ඒ අතුරින් පාලන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ සියළුම සේවා සහ සැපයීම් පිළිබඳව කටයුතු කරනු ලබයි. ඒ යටතේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට අදාලව ඉඩම් අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඉඩම් අත්පත් කර ගැනීම, ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු මෙහෙයවීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාල කටයුතු මෙහෙයවීම, අවශ්‍යතාවය පරිදි ගොඩනැගිලි කුලියට ලබා ගැනීම, දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය, දෙපාර්තමේන්තුවේ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

ආයතන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සම්බන්ධ සියළු කටයතු, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

ගොඩනැගිලි නඩත්තු ඒකකය මගින් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට සහ ගොඩනැගිලි පුනරුත්ථාපනයට හා වැඩි දියුණු කිරීමට අදාල කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සඳහා සහය වීම, ගොඩනැගිලි ඉදි කිරීම සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයතු සිදු කිරීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාල කටයුතු අධීක්ෂණය මෙන්ම

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සියළුම නඩත්තු කටයුතු සම්බන්ධයෙන්ද කටයතු කරනු ලබයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය කම්කරු ක්ෂේත්‍රයට අදාල අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය වේ. මෙමගින් කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහා ද කම්කරු නිති ක්ෂේත්‍රයට අදාල සියළුම අන පනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය තුළ පොත්පත්, ප්‍රකාශන හා සඟරා 180,000 කට අධික සංඛ්‍යාවක් තැන්පත් කර ඇත. ඒ යටතේ කම්කරු නීති සම්බන්ධ අන පනත්, පොත් පත්, සඟරා, වාර ප්‍රකාශන, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශන, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රකාශන, ළමා ශ්‍රමය සම්බන්ධ ප්‍රකාශන ආදී වශයෙන් මෙම එකතුව වර්ගීකරණය කළ හැකි වේ.

1.5.11 මුදල් අංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරකම් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා සහ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා භෞතික සම්පත් මෙන්ම මූල්‍ය සම්පත් ද අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව, වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව පරිපාලනය කිරීම මුදල් අංශය විසින් සිදු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනය කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් සිදු කිරීම උදෙසා මුදල් අංශය පහත පරිදි ක්‍රියාත්මක වේ.

1.5.11.1 දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම.
1.5.11.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා නිසි පරිදි බෙදාහැරීම.
1.5.11.3 ප්‍රාදේශීය කාර්යාල සඳහා අග්‍රිම නිකුත් කිරීම හා එම කාර්යාලවල මූල්‍ය අධීක්ෂණය.
1.5.11.4 මාසික අර්ධ වාර්ෂික හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම හා අදාල පාර්ශවයන් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම.
1.5.11.5 බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන සියලුම ලැබීම් හා ගෙවීම් කටයුතු නීතිරීති ප්‍රකාරව මෙහෙයවීම.
1.5.11.6 දෙපාර්තමේන්තුව සතු ප්‍රාග්ධන වත්කම් සමීක්ෂණය හා අපහරණ කටයුතු.
1.5.11.7 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වැටුප්, ණය අත්තිකාරම් හා දීමනා ගෙවීම.

1.5.12 සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ඒ යටතේ වන ඉලක්කයන්ට අදාලව දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන් හා ප්‍රාදේශීය කාර්යාල මෙහෙයවීමේ කටයුතු

සම්බන්ධීකරණය, දෙපාර්තමේන්තුවේ අංශයන්හි ප්‍රගතිය සහ ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පවත්වනු ලබන කම්කරු කොමසාරිස්වරුන්ගේ මාසික රැස්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, කම්කරු අමාත්‍යාංශය විසින් ප්‍රගති සමාලෝචනය සඳහා මාසිකව පවත්වනු ලබන කළමනාකරණ මෙහෙයුම් කමිටු රැස්වීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සකස් කිරීම සහ එම රැස්වීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, කම්කරු අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉල්ලුම් කරනු ලබන දත්ත හා වාර්තා සැපයීම **සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ** සැලසුම් හා ප්‍රගති සමාලෝචන කාර්ය භාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු මෙහෙයවීමේ වගකීම මෙම අංශය මගින් දරනු ලබයි. ඒ යටතේ, ප්‍රාදේශීය කාර්යාලයන්හි වාර්ෂික ප්‍රගති සමාලෝචන සැලැස්ම සකස් කිරීම හා අධීක්ෂණය මෙම අංශය විසින් සිදු කරනු ලබයි. එහිදී කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මගින් එක් එක් කලාපයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම මෙන්ම අංශය මගින් අධීක්ෂණ කණ්ඩායම් යොමු කර එක් එක් කාර්යාලයන්හි ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමද සිදු කරනු ලබයි.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා සියළුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මෙන්ම දෙපාර්තමේන්තුවේ සියලු අංශ ක්‍රියාත්මක වන ආකාරය සහ අදාල වාර්ෂික ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ. එහිදී, දෙපාර්තමේන්තුවේ අංශ හා දිස්ත්‍රික් කාර්යාල වල කාර්යයන් අධීක්ෂණය හා එමගින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අදාල කාර්යාලයන්හි ප්‍රගතිය තව දුරටත් වර්ධනය කර ගැනීම පිණිස අවශ්‍ය නිර්දේශ ලබා දීම මෙම අංශයේ අධීක්ෂණ කාර්යය වශයෙන් ඉටු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වන පුහුණුව ලබා දීම බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධරයන් යොමු කිරීම, විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යය ඉටු කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබන මානව සම්පත් සංවර්ධනය පිළිබඳ කාර්යභාරය වේ.

එසේම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අවශ්‍ය කම්කරු නීති සම්බන්ධ අණ පනත් සහ පඩි පාලක සභා තීරණ මුද්‍රණය කර ලබා දීම, කම්කරු නිලධාරීන්ට ක්ෂේත්‍ර කටයුතු සඳහා උපයෝගී කර ගැනීම පිණිස අවශ්‍ය වන ශ්‍රමික පරීක්ෂණ වාර්තා, මාසික දින පොත් ආදී පොදු ආකෘති පත්‍ර මුද්‍රණය කර ලබා දීම ආදී මුද්‍රණ කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

1.5.13 සංඛ්‍යාලේඛන අංශය

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාලව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම සංඛ්‍යාලේඛන අංශයේ කාර්යභාරය වේ. මෙම අංශය සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ කම්කරු කොමසාරිස්ගේ අධීක්ෂනය යටතේ ක්‍රියාත්මක වේ.

1.5.14 අභ්‍යන්තර විගණන අංශය

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින් ද සිය සියලු ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුව විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් පරිදි සිදු කල යුතු වේ. ඒ අනුව, එම කටයුතු සම්පත්වල ඉහල උපයෝගිතාවයක් සහිතව මනා විනිවිද භාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේද යන්න අධීක්ෂණය සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් ගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන් හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

මෙම අරමුදල පිළිබඳ වැඩිදුර විස්තර ඉහත 01 පරිච්ඡේදයෙහි 1.5.8 යටතෙහි සහ 02 පරිච්ඡේදයෙහි සඳහන් කර ඇත.

දෙවන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම දෙපාර්තමේන්තුවෙ හි දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම දෙපාර්තමේන්තු වේ මූලික හා අත්‍යාවශ්‍ය කාර්යය වේ.

මේ සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් 04 යටතේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

2.1.1. සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම

දිවයින පුරා විසිරී ඇති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම උදෙසා 2020 වර්ෂයේදී පහත කාර්යයන් ඉටු කරන ලදී.

2.1.1.1. යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සේව්‍ය සේවක දෙපාර්ශවයට කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පහත පරිදි සංවිධානය කොට පැවැත්වීම.

අ.අ.	වැඩසටහන	වැඩසටහන් ගණන
01	මානව සම්පත් සංවර්ධන අංශයෙන් සිදුකල සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහන්	37
02	මානව සම්පත් සංවර්ධන අංශයෙන් සිදුකල අර්ධ රාජ්‍ය ආයතනවල පවත්වන ලද වැඩසටහන්	06
03	ආයතන පරීක්ෂා කිරීම්	424
04	ආයතනවල ඉල්ලීම මත සම්පත්දායකයින් ලබාදී ඇති වැඩසටහන්	21

වගුව 2.1 - මානව සම්පත් සංවර්ධන අංශය විසින් සිදු කරනු ලැබූ කාර්යයන් - 2020

2.1.1.2. සමාජ කතිකාව කොතරම් දුරට ආයතන තුළ තහවුරු වී තිබේද යන්න පිළිබඳව වාර්ෂිකව නිෂ්පාදන, සේවා, ඇඟලුම් හා වතු අංශය නියෝජනය වන පරිදි කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් දීප ව්‍යාප්තව සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලියක් වාර්ෂිකව

පැවැත්වීමටත් කටයුතු කරනු ලබයි. 2019 වර්ෂය සඳහා වන මෙම තරඟයේ මූලික කටයුතු සිදු කර තිබූ අතර සම්මාන ප්‍රදානෝත්සවය 2020.01.16 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

ඡායාරූපය 2.1 - මානව සම්පත් සංවර්ධන අංශයෙන් සිදුකළ සේවා සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහනක්

ඡායාරූපය 2.2 - සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලියේ සම්මාන ප්‍රදානෝත්සවය 2019

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ පැවති තත්වය මත 2020 වර්ෂයේදීකිරීමට සැලසුම් කරන ලද වැඩසටහන් පැවැත්වීම සීමා කිරීමට සිදු විය.

2.1.2. කාලීන පරීක්ෂණ සිදු කිරීම

කාලීන පරීක්ෂණ සිදු කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ වැඩ පියසේ දී සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති හා රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක වේ ද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේවා සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම පාලනය කර සුහද සම්බන්ධතාවයක් ඇති කිරීමයි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා කලාප කම්කරු කාර්යාල 11 ක්, ඒ යටතේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක් හා උප කම්කරු කාර්යාල 17 ක් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් ශ්‍රී ලංකාව ම ආවරණය වන පරිදි ස්ථාපනය කර ඇති අතර, ප්‍රධාන කාර්යාලයේ අංශයන් ද ඇතුළුව 2020.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සේවය කරන මුළු කම්කරු නිලධරයන් සංඛ්‍යාව 488 ක් වේ. 2020 වසරේදී කම්කරු නිළධරයන් විසින් සිදු කල සමස්ත කාලීන පරීක්ෂණ සංඛ්‍යාව 64,708 ක් වේ.



ප්‍රස්තාරය - 2.1 කාලීන පරීක්ෂණ - 2019 වර්ෂයේ ප්‍රගතියට සාපේක්ෂව 2020 වර්ෂයේ ප්‍රගතිය

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව අඩු වී ඇත. එයට හේතුව, වනුයේ 2020 පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන් හි දී සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබීම සහ පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීම වේ.

2.1.3.ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංගනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම

ව්‍යවස්ථාපිත නීති උල්ලංගනය වීම් හා කාර්මික ආරාවුල් ඇතිවීමට ඉඩ ඇති අවස්ථා හා වැඩ වර්ජන පිළිබඳ පැමිණිලි ප්‍රධාන කාර්යාලයට, දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාල වෙත යොමු කිරීම සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල, කලාප කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ අදාල අංශ මගින් ද ඒවා විසඳීමට කටයුතු කරනු ලැබේ. එම උත්සාහය අසාර්ථක වුවහොත් එම කාර්මික ආරවුල්, විෂයභාර ඇමතිතුමා විසින් බේරුම්කරුවෙකු වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමුකර විසඳුමක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් පහත පරිදි වේ.



ප්‍රස්තාරය 2.2 - 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය තුළ ලැබුණු සහ විසඳූ පැමිණිලි සංඛ්‍යාව සාපේක්ෂව පහළ අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

එසේම 2020 වර්ෂය තුල කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලද පැමිණිලි පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂය තුල ලැබුණු පැමිණිලි සංඛ්‍යාව		වර්ෂය තුල ලද පැමිණිලි සංඛ්‍යාවෙන් විසඳූ පැමිණිලි සංඛ්‍යාව	
ලැබුණු පැමිණිලි සංඛ්‍යාව	එම පැමිණිලි සඳහා අදාල සේවක සංඛ්‍යාව	විසඳූ පැමිණිලි සංඛ්‍යාව	එම පැමිණිලි සඳහා අදාල සේවක සංඛ්‍යාව
2262	8913	1044	4850

වගුව 2.2 - 2020 වර්ෂය තුල කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ලද පැමිණිලි සංඛ්‍යාව

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තු නිලධරයන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාවේ සුළු වැඩි වීමක් දක්නට ඇත.

වර්ෂය	සිදුවීම	වතු	ඉදිකිරීම්	නිෂ්පාදන	පතල් කැණීම්	නවාතැන් හා ආහාර සැපයුම්	අර්ධ රාජ්‍ය	වෙනත් සේවා	මුළු එකතුව
2019	වැඩ වර්ජන වාර්තා වීම්	8	1	11	-	-	-	1	21
	සහභාගි වූ සේවක සංඛ්‍යාව	1952	100	4701	-	-	-	16	6769
	අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව	28218	200	26403	-	-	-	16	54837
2020	වැඩ වර්ජන වාර්තා වීම්	13	-	12	-	2	-	1	28
	සහභාගි වූ සේවක සංඛ්‍යාව	1936	-	4040	-	64	-	85	6125
	අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව	9375	-	12806	-	324	-	85	22590

වගුව 2.3 - වැඩ වර්ජන පිළිබඳ දත්ත වාර්තා - 2019 වසරට සාපේක්ෂව 2020 වර්ෂය

කාර්මික ආරාවුල් නිරවුල් කිරීමේදී සාමූහික ගිවිසුම් වලට එළඹීම මගින් සේව්‍ය සේවක දෙපාර්ශවය වෙත වඩා ස්ථිර විසඳුමක් ලැබීම මෙන්ම කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට හැකියාව ද ලැබේ. එසේම, සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුළින් පෙළඹවීමක් සිදුකිරීමට දෙපාර්තමේන්තුව විසින් උත්සාහ ගනු ලැබේ. 2020 වර්ෂය තුළදී ගැසට් පත්‍රයේ පළ කරන ලද සාමූහික ගිවිසුම් 15 ද ඇතුළුව 2020.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 148 කි.



ප්‍රස්තාරය 2.3 - සාමූහික ගිවිසුම් ගැසට් පත්‍රයේ පළ කිරීම - 2020

ප්‍රාදේශීය කාර්යාල මගින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මගින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ ආරාවුල්, බේරුම්කරණයට හෝ කාර්මික අධිකරණයකට යොමු කිරීම සිදු කරනු ලබන අතර 2020 වර්ෂයේ දී අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම් 59 ක් ද ප්‍රදාන නිකුත් කිරීම් 22 ක් ද සිදු කර ඇත.

සැම වෘත්තීය සමිතියක් ම කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම අනිවාර්ය කටයුත්තකි. ඒ අනුව, 2020 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති සංඛ්‍යාව 105 කි. 2020.12.31 දිනට ක්‍රියාත්මක වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 1843 කි.

2.2. විශේෂ විමර්ශන

සාමාන්‍ය පරිදි සිදු කෙරෙන කම්කරු පරීක්ෂණ සහ පැමිණිලි පරීක්ෂණවලට අමතරව, යම් පැමිණිලි විමර්ශනයක් හෝ යම් ආයතනයක සිදු කරන ලද පරීක්ෂණයක් සිදුවූ ආකාරය පිළිබඳ සෑහීමට පත් නොවන අයකු විසින් ස්වාධීන පරීක්ෂණයක් නැවත ලබාගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි නැවත විමර්ශනය කරනු ලැබේ.

ඒ අනුව, 2020 වර්ෂයේදී කාර්යාලීය හා ස්ථානීය පැමිණිලි පරීක්ෂණ 198 ක් සිදු කරන ලද අතර එමගින් ගණනය කරන ලද සේවක අර්ථ සාධක අරමුදල් හිඟ වටිනාකම රු. 5,767,050.00 ක් වන අතර ගණනය කරන ලද වෙනත් හිඟ ව්‍යවස්ථාපිත දීමනා වටිනාකම් රු.12,055,291.00 වේ.

එසේම, අර්ධ රාජ්‍ය ආයතන වලට අදාල පැමිණිලි පරීක්ෂණ 19 ක් ද වර්ෂය තුළ දී සිදු කර ඇත.

2.3. ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. මේ අනුව, 2020 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

	වැඩසටහන/ක්‍රියාකාරකම්	භෞතික ප්‍රගතිය
1	කාලය ඉකුත් වන පඩි පාලක සභා සඳහා නියෝජිතයන් පත් කිරීම	15
2	දින 05 වැඩ සතිය සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම	197
3	කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීමේ හා තැනීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ අවම වැටුප් මාසිකව ප්‍රසිද්ධ කිරීම	10
4	සාමූහික ගිවිසුම් වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම	36
5	2016 අංක 04 දරණ අය වැය සහන දීමනාව පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථ නිරූපණ ලබා දීම	07
6	පඩි පාලක සභා ආඥා පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථ නිරූපණ ලබාදීම	24
7	සාප්පු හා කාර්යාල පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථ නිරූපණ ලබාදීම	14
8	පඩි පාලක සභා අඥා පනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම	23
9	පඩි පාලක සභා අඥා පනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ දඩ අරමුදල් පිහිටුවීම සහ දඩ අරමුදලින් වියදම් කිරීමට ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම	02
10	පඩි පාලක සභා සම්බන්ධව විශේෂ නිවාඩු දින හා මැතිවරණ නිවාඩු පුවත්පත් මගින් දැනුම් දීම	01
11	ශ්‍රම ප්‍රමිති අංශය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට්, පනත් සංශෝධන සහ රෙගුලාසිවල මෑදු පිටපත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කිරීම	44
12	ආරක්ෂක සේවා ආයතන සඳහා වාර්ෂික බලපත්‍ර අළුත් කිරීමට අදාළ නිෂ්කාශණ සහතික නිකුත් කිරීම	22

වගුව 2.4 - ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් -2020

2.4. සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව සඳහා සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම

2.4.1. වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම

කර්මාන්ත ශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා වන පරිදි සේවා ස්ථානයේ පරිසරය සැකසීම සේවායෝජකයාගේ අනිවාර්ය වගකීමක් වන අතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට ඇති හිමිකම මෙ මගින් තහවුරු කර ඇත.

2.4.1.1. සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම

සේවා ස්ථානයක සෞඛ්‍ය ගැටලු/අනතුරු සිදුවීමට ඇති අවස්ථා තිබේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා පාරිසරික තත්ත්ව අධීක්ෂණ, ජෛව විද්‍යාත්මක අධීක්ෂණ, ශබ්ද මැනීමේ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව 2020 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

	වැඩසටහන්/ක්‍රියාකාරකම්	වැඩසටහන්/ක්‍රියාකාරකම් සංඛ්‍යාව
1	පාරිසරික මිනුම්	78
2	ජෛව විද්‍යාත්මක අධීක්ෂණ	1525
3	වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන්	183

වගුව 2.5 - සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම සඳහා සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් - 2020

2.4.1.2. සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

සේවා ස්ථානයක සේවකයන්ගේ සෞඛ්‍යමය ආරක්ෂාව පිළිබඳව සේව්‍ය සේවක දෙපාර්ශවයම ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් 137 ක් පවත්වා ඇත. එසේම, කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ කර්මාන්තශාලාවල වැඩබිම්වල කටයුතු සිදු කල යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදී.

2.4.1.3. වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දීම

වෛද්‍ය හේතු මත සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ඉල්ලුම් කරන අයදුම්කරුවන් වෙනුවෙන් වෛද්‍ය මණ්ඩල 16 ක් පවත්වා තීරණ ලබා දී ඇත.

2.4.2. අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුල සේවයෙහි යෙදෙන සේවකයන් හට විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මගින් හෝ වෙනත් කුමන ආකාරයකට හෝ ශාරීරික හානියක් හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතින අතර ඒවා අවම කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10 ක් ඇති අතර ඒවායෙහි සේවයේ නියුතු සුදුසුකම් ලත් ඉංජිනේරුවරුන් විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්ය ඉටු කරනු ලැබේ.

2.4.2.1. නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

නව කර්මාන්තශාලා ආරම්භ කිරීමේදී හෝ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කල අවස්ථා වලදි එම කර්මාන්තශාලා නියමිත ප්‍රමිතීන් අනුගමනය කර තිබේ ද යන්න පරීක්ෂා කර බලා එසේ නොමැති නම් ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් දීම හා නියමිත ප්‍රමිතින් හා සම්මතයන් අනුගමනය කර ඇති අවස්ථාවලදී ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. 2020 වසර අවසන් වන විට දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සමස්ත කර්මාන්තශාලා සංඛ්‍යාව 31,833 කි. මෙම වසර තුල ලියාපදිංචි කරන ලද නව කර්මාන්තශාලා 738 ද එයට ඇතුලත්ය.

2.4.2.2. ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා සහතික කිරීම

කර්මාන්තශාලා සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒවා කර්මාන්තශාලා ආඥා පනතට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීම හා ඒ බව සහතික කිරීම සිදු කෙරේ. 2020 වර්ෂය තුලදී ගොඩනැගිලි පිඹුරුපත් 106 ක් පරීක්ෂා කර සහතික කර ඇත.

2.4.2.3. කර්මාන්තශාලා පරීක්ෂා කිරීම

සෑම දිස්ත්‍රික් කර්මාන්තශාලා ඉංජිනේරු කාර්යාල බල ප්‍රදේශයක් තුළ ම පවත්නා කර්මාන්තශාලා නිරන්තර පරීක්ෂා කිරීමට ලක් කරන අතර එමගින් අනතුරු ඇති වීමේ තත්ත්වයන් කල් තබා හඳුනාගෙන අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, 2020 වසර තුල කර්මාන්තශාලා 2,130 ක ප්‍රමාණයක් පරීක්ෂා කර ඇත.

2.4.2.4. අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය

2020 වර්ෂය තුල මරණීය අනතුරු 71 ක් හා මරණීය නොවන අනතුරු 1,116 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම අනතුරු විමර්ශනය කර අදාල නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීමත් අනතුරට හේතු සොයා ගැනීම තුලින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට

කටයුතු කිරීමට සේවායෝජකයින් දැනුවත් කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඒ අනුව, 2020 වර්ෂය තුළදී කර්මාන්තශාලා ආඥා පනත උල්ලංගනය වන පරිදි කටයුතු කල සේව්‍යයන්ට එරෙහිව නඩු 70 ක් දෙපාර්තමේන්තුව විසින් පවරා ඇත.

2.4.2.5. අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම

කර්මාන්තශාලා ආඥා පනත යටතේ පරීක්ෂාවට භාජනය කර පරීක්ෂණ වාර්තා ලබා ගත යුතු කර්මාන්තශාලා වල භාවිතා කරන හුමාල බොයිලේරු, හුමාල ග්‍රාහක, වායු ග්‍රාහක, එසවුම් යන්ත්‍ර, සෝපාන ඇතුළු අධි අන්තරාදායී යන්ත්‍ර පරීක්ෂා කරවීමට කටයුතු කිරීම සිදු කෙරේ. ඒ අනුව, 2020 වර්ෂය තුලදී එවැනි පරීක්ෂණ 9,034 ක් සිදු කර ඇත.

2.4.2.6. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

වෘත්තීය සුරක්ෂිතතාව ඉහළ නැංවීම් කටයුතු වලදී නීති රීති ක්‍රියාත්මක කිරීම මෙන්ම සේවා සේවක දෙපාර්ශවයේම දැනුම වර්ධනය කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා 2020 වර්ෂය තුලදී පැවැත්වූ වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	අදාල අංශය	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
01	ඉදිකිරීම්	06	850
02	ඇඟළුම්	09	600
03	වෙනත්	06	350
04	එකතුව	21	1800

වගුව 2.6 - වෘත්තීය සුරක්ෂිතතාව ඉහළ නැංවීම් සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් - 2020

2.4.2.7. වෘත්තීය අනතුරු හා ලෙඩ රෝග වලට ගොදුරු වන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම

2020 වර්ෂය තුලදී වාර්තා වූ අනතුරු 237 ක් කම්කරු වන්දි කොමසාරිස් වෙත යොමු කර වින්දිතයන්ට හා ඔවුන්ගෙන් යැපෙන්නන්ට වන්දි ලබා ගැනීමට කටයුතු සලසා ඇත.

මීට අමතරව වින්දිත පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් 71 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට අදාල තොරතුරු ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීමට කටයුතු කර ඇත

2.4.2.8. ලෝක සුරක්ෂිතතා දිනය සැමරුම සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ සතිය

සෑම වසරකම අප්‍රේල් 28 දිනට යෙදෙන ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජාතික සම්මන්ත්‍රණය කොවිඩ් 19 වසංගත

තත්වය හේතුවෙන් 2020 වර්ෂයේදී පැවැත්වීමට නොහැකි විය. එම හේතුව නිසාම ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ සතිය ද පැවැත්වීමට නොහැකි වූ අතර වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා වන 'අපි යන්නේ කොයි පාරේ' යන වාර්තාමය වැඩසටහන 2020.12.20 දින ප.ව. 7.00 සිට ප.ව. 7.30 දක්වා ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

තවද 2020 වර්ෂයේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා අත්පොත් 1900 ක් හා අත්පත්‍රිකා හා පෝස්ටර් 19,800 ක් මුද්‍රණය කර ඉදිරියේ දී බෙදාහැරීමට කටයුතු යොදා ඇත.

2.5. ස්ත්‍රීන්, තරුණ අය සහ ළමුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

වැඩ බිමෙහි කාන්තා වෘත්තීය හිමිකම් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය තුළින් ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් ඉටු කිරීමට කටයුතු කිරීම මෙන්ම, වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීමත්, ස්ත්‍රීන් තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ නීති රීති කාලීනව සංශෝධනය කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමත් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීමක් වේ.

2.5.1. රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීමේ 2020 වර්ෂයේ ප්‍රගතිය.

අ.අ.	කාණ්ඩය	සංඛ්‍යාව	නිරීක්ෂණ
01	දෛනික පරීක්ෂණ	123	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාලීන පරීක්ෂණ සිදු කිරීම අත් හිටුවා තිබුණි.
02	රාත්‍රී පරීක්ෂණ	66	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂයේ පළමු හා සිව්වන කාර්තුවලදී පමණක් සිදු කරන ලදී.
03	ළමා ශ්‍රමය පිළිබඳ පරීක්ෂණ	132	පැමිණිලි 104 ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. එයින් පැමිණිලි පරීක්ෂණ 06 ක දී ළමා ශ්‍රමයක් අනාවරණය වී ඇති බැවින් ඒ සඳහා නඩු කටයුතු ආරම්භ කර ඇත.
04	කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව ලැබුණු පැමිණිලි පරීක්ෂණ	23	පැමිණිලි 06 ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී.

05	කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම	652	දිස්ත්‍රික් කාර්යාල මගින් අනුමැතීන් 631 ක් ද උප කාර්යාල මගින් අනුමැතීන් 21 ක් ද වශයෙන් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එසේම, රාත්‍රී වැඩ මුර සඳහා වන සිය ඉල්ලීම් මාර්ගගතව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සේවායෝජකයන් අවස්ථාව සලසා දෙන ලදී.
06	අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ	58	ආයතන 290 ක් පරීක්ෂා කරන ලද අතර අනතුරුදායක ළමා ශ්‍රමය පිළිබඳව වාර්තා නොවීය.
07	කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ	124	ආයතන 607 ක් පරීක්ෂා කරන ලදී.
08	කම්කරු නීතිය පිළිබඳව සිදු කරන ලද දැනුවත් කිරීම්	02	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි විධායක කාර්ය මණ්ඩලය, කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ අවසන් වසර සිසුන්, කාන්තාවන්ට හා ළමයින්ට අදාල නීතිය පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී.

වගුව 2.7 - රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවත්නා නීති ක්‍රියාත්මක කිරීම- 2020

2.5.2. අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

2.5.2.1. අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම මගින් දැනුවත් කිරීම

2.5.2.1.1. ජාත්‍යන්තර කාන්තා දින සැමරුම

2020 වර්ෂයේ කාන්තා දිනය නිමිති කොටගෙන පෞද්ගලික අංශයේ විවිධ ආයතනයන්හි සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ගේ ප්‍රසූත නිවාඩු ලබා දීම සහ මව් කිරි දීමේ විවේකය නිසි පරිදි ලබා දෙන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි සමූහ පරීක්ෂණ මාලාවක් පවත්වන ලදී.

2.5.2.1.2. ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම

ශ්‍රී ලාංකික දරුවන් ළමා ශ්‍රමය සහ අනතුරුදායක ළමා ශ්‍රමයට යොමු වීමෙන් වළක්වා ගැනීමට අවශ්‍ය මැදිහත් වීම සිද කිරීමත්, ළමා ශ්‍රමය තුරන් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමත් අරමුණු කර ගනිමින් 2020 වර්ෂයේ ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම 2020 වර්ෂයේ ජුනි 12 වන දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ 10 වන මහළ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

එහිදී කම්කරු දෙපාර්තමේන්තුවේ නිල Youtube චැනලය එළි දැක්වීම සහ සංකේතාත්මකව කම්කරු නීතිය, වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය පිළිබඳ අත්පොත එළි දැක්වීම සිදු කරන ලදී. එසේම, 2018 සහ 2019 වර්ෂයන්හි දී ප්‍රාදේශීය කම්කරු කාර්යාල වෙත යොමු කරන ලද ළමා ශ්‍රමය පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් අප්‍රමාදව හා සාර්ථකව කටයුතු සිදු කරමින් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාතික වගකීමට සුවිශේෂී දායකත්වයක් දැක්වූ කම්කරු කාර්යාල ලෙස හඳුනා ගත් කළුතර, මහනුවර දකුණ සහ අනුරාධපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ නාඋල උප කම්කරු කාර්යාලය සමරු ඵලක ප්‍රදානය කර අගයන ලදී.

ඡායාරූපය 2.3 -ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම 2020

2.4.2.1.3 ලෝක ළමා දින සැමරුම

2020 වර්ෂයේ ලෝක ළමා දිනය සැමරීම සඳහා ධීවර කර්මාන්තය ආශ්‍රිතව සමූහ පරීක්ෂණ සිදු කරන මාලාවක් සිදු කරන ලදී. ඒ අනුව, 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දින පහක කාල සීමාවක් තුළදී ජාතික ළමාරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පොලිසිය යන ආයතන ද සමඟ සියළුම බහුදින ධීවර යාත්‍රා එම යාත්‍රා නැංගුරම්ලා ඇති ධීවර වරායන් හිදී සමූහ පරීක්ෂණයට ලක් කරන ලදී. එසේම, පරීක්ෂණ අතරතුර දී ධීවර ප්‍රජාව සහ අනුබද්ධිත ආයතනයන්හි නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ළමා ශ්‍රමය සහ අනතුරුදායක ළමා ශ්‍රමය පිළිබඳ අත් පත්‍රිකා බෙදා හරින ලද අතර ධීවර වරායන්හි දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීම සඳහා පෝස්ටරයක් ද ලබා දෙන ලදී.

2.5.2.2. ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව

2022 වර්ෂය වන විට ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ප්‍රතිඥා ලබා දී ඇත. ඒ අනුව, ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය දිවයිනෙන් තුරන් කිරීම සඳහා සඳහා අදාල සියළු ආයතනයන්හි සාමූහික ප්‍රයත්නයන් තවදුරටත් ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ළමා ශ්‍රමය තරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව (NSC) පිහිටුවන ලද්දේ අදාල පාර්ශවකරුවන් විසින් අදාල ඉලක්ක සාමූහික ප්‍රයත්නයෙන් සාක්ෂාත් කර ගන්නා බවට සහතික කිරීම සඳහාය.

2020 ජූලි 20 වන දින අදාල ආයතන නියෝජනය කරමින් නිලධාරීන් 26 දෙනෙකුගේ සහභාගීත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ 04 වන මහළ ශ්‍රවණාගාරයේදී ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව පවත්වන ලදී.

එසේම, උක්ත දින පැවති කමිටුවේ දී යෝජනා කර ගන්නා ලද පරිදි තාක්ෂණික කමිටුව අදාල ආයතනවල නිලධාරීන් 11 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2020 දෙසැම්බර් 18 වන දින කම්කරු දෙපාර්තමේන්තුවේ 04 වන මහළ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

2.5.2.3. වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් කාන්තාවන්, තරුණ අය සහ ළමුන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් සිදු කරන ලද කාර්යයන් හිදී දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායකත්වය සපයා ඇත.

❖ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුවද කම්කරු නිලධරයන් රටපුරා පැවති දිස්ත්‍රික් / ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු රැස්වීම් 19ක් සඳහා සහභාගී වූ අතර, එහිදී කමිටු සාමාජිකත්වය "ළමා ශ්‍රමය" පිළිබඳව දැනුවත් කරන ලදී. එසේම, 2021 ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාත්‍යන්තර වර්ෂය පිළිබඳ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සියළුම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරනු ලැබූ අතර 2021 වර්ෂයේ දින දර්ශනයක්ද බෙදා හරින ලදී.

2.5.2.4. අනෙකුත් විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු

❖ ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය ශුන්‍යත්වයට පත් කිරීමේ වැඩසටහන - විශේෂ පරීක්ෂා කිරීම් හා වැටලීම් මාලාව

ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය සහ අනර්ථකාරී රැකියා අවම කිරීම තුළින් දරු පරපුරට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණ පෙරදැරිව මුළු දිවයිනම ආවරණය වන පරිදි සියළුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල සම්බන්ධීකරණය කරමින් වැටලීම් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී වර්ෂයේ පළමු කාර්තුව තුළදී වැටලීම් 14 ක්ද සිව් වන කාර්තුව තුල වැටලීම් 44 ක්ද සිදු කරන ලදී.

2.5.2.5. පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමේ කටයුතු වල ප්‍රගතිය

1956 අංක 47 දරණ ස්ත්‍රීන් හා තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනතේ අංක 24 දරණ සංශෝධනය අනුව පනතේ 20 (අ) වගන්තිය යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ වයස අවුරුදු 18 ට අඩු කිසිවෙකු අනතුරුදායක රැකියා වල හෝ රැකියාවක යෙදවීම තහනම් කොට ඇත. 2018 වර්ෂයේ දී අනතුරුදායක රැකියා ලැයිස්තුව සංශෝධනය කොට වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයන්ගේ කායික හා මානසික සෞඛ්‍යයට හා ආරක්ෂාවට හානිකර රැකියා අවස්ථාවන් හඳුනාගනිමින් “නව අනතුරුදායක රැකියා රෙගුලාසිය” කෙටුම්පත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. මෙම කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර, පළමු කෙටුම්පත සඳහා කම්කරු දෙපාර්තමේන්තු නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට ද දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ළමයින් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන පනත් 5ක කෙටුම්පත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

2.6. සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන් හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ.

2019 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලෙහි වටිනාකම රුපියල් මිලියන 2,540,438 ක් වන අතර, අරමුදලේ සක්‍රීය සාමාජික සංඛ්‍යාව මිලියන 18.9 ක් වේ.

2.6.1. **සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා ආයතන ලියාපදිංචි කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ආවරණය වන සියලුම සේව්‍යයන් අරමුදලේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව, 2020 වර්ෂය තුළ ලියාපදිංචි වූ සේවායෝජක සංඛ්‍යාව 1453 කි. 2020 වර්ෂය තුළ අරමුදල වෙත දායක මුදල් බැර කර ඇති සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව 94,171 කි. වර්ෂය තුළ අරමුදලට බැර වූ දායක මුදල රුපියල් මිලියන 125,366.65 ක් වේ.

2.6.2. **සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ආවරණය වන සියළු සේවකයින් වෙත සාමාජික අංක ලබා දී ඔවුන් අරමුදලේ ලියාපදිංචි කරවීම සේවායෝජකගේ වගකීම වන අතර එය අධීක්ෂණය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව 2020 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සාමාජික සංඛ්‍යාව 167,352 ක් වේ. එසේම, මේ වන විට සක්‍රීය සාමාජික ගිණුම් මිලියන 2.91 ක් පවතී.

දායක මුදල් පැහැර හරින සේවායෝජකයන්ගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රථම නිවේදන හා රතු නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ. 2020 වර්ෂයේ දී එවැනි ප්‍රථම නිවේදන 12,232 ක් නිකුත් කිරීම මගින් රුපියල් මිලියන 5,065 ක මුදලක් ද, රතු නිවේදන 9,253 ක් නිකුත් කිරීම මගින් රුපියල් මිලියන 3,941 ක මුදලක් ද අයකර ගෙන ඇත.

2.6.3. සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හා දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 35 කින් හා උප කම්කරු කාර්යාල 12 කින් සහ කලාප කම්කරු කාර්යාල 10 කින් සාමාජිකයන්ට ප්‍රතිලාභ ලබා ගැනීමේ පහසුකම් සලසා ඇති අතර 2020 වර්ෂය තුල එසේ ප්‍රතිලාභ ලැබූ සාමාජිකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.



ප්‍රස්ථාරය 2.4 -ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම් - 2020

2.6.4. අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

2020 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදල යටතේ අනුමත අර්ථසාධක අරමුදල් පවතින ආයතන 117 ක් ලියාපදිංචිව ඇති අතර, සමස්ත සාමාජික සංඛ්‍යාව 186,743 කි. එම අරමුදල්වල දායක මුදල් බැර කිරීම, ප්‍රතිලාභ ගෙවීම ඇතුලුව ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරමින් නිසි ලෙස ක්‍රියාත්මක නොවන අරමුදල් කම්කරු කොමසාරිස් ජනරාල් යටතට පවරා ගනු ලැබේ.

2020 වර්ෂයේදී ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව	52
2020 වර්ෂයේදී විසඳා ගොනු පියවා ඇති පැමිණිලි සංඛ්‍යාව	40
2020 වර්ෂයේදී ක්ෂේත්‍ර නිලධරයන් විසින් අධීක්ෂණය කරන ලද පු.අ.අ. සම්බන්ධ වාර්තා සංඛ්‍යාව	72
2020 වර්ෂයේදී අධීක්ෂණය සිදු කොට ඇති ආයතන සංඛ්‍යාව	72

වගුව 2.8 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය ප්‍රගතිය - 2020

2.6.5. **අරමුදල මගින් සාමාජිකයන් වෙත ලබාදී ඇති ප්‍රතිලාභ**

2.6.5.1. සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජික ගිණුම් ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා දීම

සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල් සාමාජික ගිණුම් ශේෂය ඇපයට තබා 75% ක උපරිමයක් දක්වා නිවාස ණය ලබා ගැනීමේ පහසුකම සලසා ඇත. ඒ අනුව 2020 වර්ෂය තුළ නිවාස ණය අයදුම්පත් 6,591ක් සඳහා අනුමැතිය ලබා දී ඇත.අනුමැතිය ලබා දී ඇති මුදල රු.බිලියන 3.43කි .

2.6.5.2. සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

සේවා සේවක දෙපාර්ශවය තුළ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව ඇති දැනුවත් භාවය වර්ධනය කිරීම හා ලියාපදිංචිය පුළුල් කිරීමේ අරමුණින් ජංගම සේවා වැඩසටහන් 03 ක් රත්ගම, පෝද්දල සහ හෝමාගම යන ප්‍රදේශයන් හිදී පවත්වන ලදී.

2.6.5.3. ප්‍රධාන කාර්යාලය විසින් ලබා දුන් සේවා ප්‍රාදේශීය කාර්යාල දක්වා විමධ්‍යගත කිරීම තුළින් සාමාජිකයන් වෙත පෙරට වැඩි පහසුකම් සලසා ඇත.

2.7. සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය

සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු එම අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවා සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේවා සේවක සහයෝගීතාවය වර්ධනය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.



ප්‍රස්ථාරය2.5 -සියලුම දිස්ත්‍රික් කාර්යාල මගින් පවරන ලද සහ විසඳී ඇති නඩු - 2020

අධිකරණය	**2020 වර්ෂයට ඉදිරියට ගෙන ආ ශේෂය**	**2020 වර්ෂයේදී අවසන් කරන ලද නඩු සංඛ්‍යාව**
ශ්‍රේෂ්ඨාධිකරණය	114	8
අභියාචනාධිකරණය	160	17
මහාධිකරණ	120	30
දිසා අධිකරණ සහ වාණිජ මහාධිකරණ	216	21

වගුව 2.9 අධිකරණ අනුව නඩු වල කාර්ය සාධනය - 2020

2.8. පරිපාලනය

2.8.1. පරිපාලනය

පාලන අංශය ශාඛා 04 කින් සමන්විත වේ. එනම්, පාලන ශාඛාව, ආයතන ශාඛාව, ගොඩනැගිලි නඩත්තු ඒකකය සහ පුස්තකාලය වේ.

ඒ අතුරින් පාලන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ සියළුම සේවා සහ සැපයීම් පිළිබඳව කටයුතු කරනු ලබයි. ඒ යටතේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට අදාලව ඉඩම් අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඉඩම් අත්පත් කර ගැනීම, ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු මෙහෙයවීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාල කටයුතු මෙහෙයවීම, අවශ්‍යතාවය පරිදි ගොඩනැගිලි කුලියට ලබා ගැනීම, දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය, දෙපාර්තමේන්තුවේ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

ආයතන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සම්බන්ධ සියළු කටයතු, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

සිරිත් පරිදි සිදු කරන එම කටයුතුවලට අතිරේකව පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2020 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සන්නිවේදනය සඳහා ස්ලැක් යෙදවුම (Slack Application) හඳුන්වාදීම
- කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීම සඳහා දිවයින පුරා සියලු කම්කරු කාර්යාල, දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ සියලු ශාඛාවන්ට සෞඛ්‍ය මාර්ගෝපදේශ නිකුත් කිරිම
- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා අවශ්‍ය පුද්ගල ආරක්ෂණ උපකරණ නිකුත් කිරිම
- කොවිඩ් - 19 වසංගත කාලසීමාව තුළ සේවයට වාර්තා කිරිම පිණිස නිලධාරීන්ට සේවා මුර ක්‍රමයක් හඳුන්වා දීම

2.8.2. ඉදි කිරීම්

ගොඩනැගිලි නඩත්තු ඒකකය මගින් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට සහ ගොඩනැගිලි පුනරුත්ථාපනයට හා වැඩි දියුණු කිරීමට අදාල කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සඳහා සහය වීම, ගොඩනැගිලි ඉදි කිරීම සම්බන්ධයෙන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයතු සිදු කිරීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාල කටයුතු අධීක්ෂණය මෙන්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සියළුම නඩත්තු කටයුතු සම්බන්ධයෙන්ද කටයතු කරනු ලබයි.

ඒ අනුව, 2020 වර්ෂයේදී පහත කාර්යාලයන් හි යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.

2020 වසර සඳහා ප්‍රතිපාදනය (ජනවාරි සිට දෙසැම්බර්) (රු. මි.)	**සැලසුම් කළ ක්‍රියාකාරකම්/ව්‍යාපෘති (ප්‍රධාන)**	**2020.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මි.**	**2020.12.31 දිනට දිනට භෞතික ප්‍රගතිය**
22	කුරුණෑගල කම්කරු කාර්යාලය ඉදිකිරීම (ගිනි ආරක්ෂණ පද්ධතිය)	22	20%
-	අම්බලන්ගොඩ කම්කරු කාර්යාලය ඉදිකිරීම	-	අදියර II (95%)
53.70	බදුල්ල කම්කරු කාර්යාලය ඉදිකිරීම	53.70	අදියර I (52%)
19.53	දඹුල්ල කම්කරු කාර්යාලය ඉදිකිරීම	19.53	අදියර II (100%)
62	හැටන් කම්කරු කාර්යාලය ඉදිකිරීම	62	අදියර I (62%)

එසේම, පසුගිය වර්ෂයේදී විවෘත කරන ලද 'මෙහෙවර පියෙස' ගොඩනැගිල්ලෙහි දෙපාර්තමේන්තුවේ අංශයන් ස්ථාපනය කිරීමේ කටයුතු ද 2020 වර්ෂය තුළ දී සිදු කරන ලදී.

2.8.3. **පුස්තකාලය, කෞතුකාගාරය සහ තොරතුරු සේවාව**

කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය කම්කරු ක්ෂේත්‍රයට අදාල අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය වේ. මෙමගින් කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහා ද කම්කරු නිති ක්ෂේත්‍රයට අදාල සියළුම අන පනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය තුළ පොත්පත්, ප්‍රකාශන හා සඟරා 180,000 කට අධික සංඛ්‍යාවක් තැන්පත් කර ඇත. ඒ යටතේ කම්කරු නීති සම්බන්ධ අන පනත්, පොත් පත්, සඟරා, වාර ප්‍රකාශන, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශන, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රකාශන, ළමා ශ්‍රමය සම්බන්ධ ප්‍රකාශන ආදී වශයෙන් මෙම එකතුව වර්ගීකරණය කළ හැකි වේ.

පුස්තකාලය විසින් පොත් බැහැරදීමේ සේවාව, විමර්ශන සේවාව, ඡායා පිටපත් සේවාව, පුවත්පත් ලිපි එකතුව, පටුන පිටු සේවාව සහ අන්තර් පුස්තකාල පිරුළු සේවාව යන සේවාද සපයනු ලැබේ.

2020 වර්ෂයේදී පුස්තකාලය උදෙසා ග්‍රන්ථ 30 ක් ද, විදේශීය සඟරා 13 ක් ද මිලදී ගන්නා ලද අතර සමාජිකයන් සඳහා පොත් බැහැරදීම් 2870 ක් සිදු කර ඇත. බාහිර පාඨකයන් 507 ක් සඳහා ද විමර්ෂණ සේවා පහසුකම සපයා ඇත.

කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින පැරණි අන පනත් හා කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින ලේඛණ සංරක්ෂණය කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් කෞතුකාගාරයක් ද පවත්වා ගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රය ආරම්භයේ සිට අද දක්වා විකාශනය වූ අයුරු එම කෞතුකාගාරය මගින් මැනවින් පිළිබිඹු කරයි.

2.9. මූල්‍ය කළමනාකරණය

2020 වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව හා ඵලදායීව අදාල අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රියා කර ඇත.

ඒ අනුව, 2020 වර්ෂයේදී වාර්ෂික අයවැය මගින් වෙන් කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදනයන්ගෙන් 94.6% ක ප්‍රතිශතයක් ද, ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 93.14% ක ප්‍රතිශතයක් ද මේ සඳහා යොදා ගනිමින් මූල්‍ය කළමනාකරණ ඉලක්ක සපුරා ඇත.

පුනරාවර්තන වියදම්	ප්‍රතිපාදනය (රු)	2,051,750,000
	වියදම (රු)	1,941,023,284
ප්‍රාග්ධන වියදම්	ප්‍රතිපාදනය (රු)	1,053,800,000
	වියදම (රු)	981,560,511

වගුව 2.10 - 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

2.10. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් වෙත මෙහෙයවීම හා මානව සම්පත් සංවර්ධනය

2.10.1. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් කරා මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ඒ යටතේ වන ඉලක්කයන්ට අදාලව දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන් හා ප්‍රාදේශීය කාර්යාල මෙහෙයවීමේ කටයුතු සම්බන්ධීකරණය, දෙපාර්තමේන්තුවේ අංශයන්හි ප්‍රගතිය සහ ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පවත්වනු ලබන කම්කරු කොමසාරිස්වරුන්ගේ මාසික රැස්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, කම්කරු අමාත්‍යාංශය විසින් ප්‍රගති සමාලෝචනය සඳහා මාසිකව පවත්වනු ලබන කළමනාකරණ මෙහෙයුම් කමිටු රැස්වීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සකස් කිරීම සහ එම රැස්වීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, කම්කරු අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉල්ලුම් කරනු ලබන දත්ත හා වාර්තා සැපයීම **සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ** සැලසුම් හා ප්‍රගති සමාලෝචන කාර්ය භාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු මෙහෙයවීමේ වගකීම මෙම අංශය මගින් දරනු ලබයි. ඒ යටතේ, ප්‍රාදේශීය කාර්යාලයන්හි වාර්ෂික ප්‍රගති සමාලෝචන සැලැස්ම සකස් කිරීම හා අධීක්ෂණය මෙම අංශය විසින් සිදු කරනු ලබයි. එහිදී කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මගින් එක් එක් කලාපයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම මෙන්ම අංශය මගින් අධීක්ෂණ කණ්ඩායම් යොමු කර එක් එක් කාර්යාලයන්හි ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමද සිදු කරනු ලබයි.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා සියළුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මෙන්ම දෙපාර්තමේන්තුවේ සියලු අංශ ක්‍රියාත්මක වන ආකාරය සහ අදාල වාර්ෂික ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ. එහිදී, දෙපාර්තමේන්තුවේ අංශ හා දිස්ත්‍රික් කාර්යාල වල කාර්යයන් අධීක්ෂණය හා එමගින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අදාල කාර්යාලයන්හි ප්‍රගතිය තව දුරටත් වර්ධනය කර ගැනීම පිණිස අවශ්‍ය නිර්දේශ ලබා දීම මෙම අංශයේ අධීක්ෂණ කාර්යය වශයෙන් ඉටු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වන පුහුණුව ලබා දීම බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධරයන් යොමු කිරීම, විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යය ඉටු කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබන මානව සම්පත් සංවර්ධනය පිළිබඳ කාර්යභාරය වේ.

එසේම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අවශ්‍ය කම්කරු නීති සම්බන්ධ අණ පනත් සහ පඩි පාලක සභා තීරණ මුද්‍රණය කර ලබා දීම, කම්කරු නිලධාරීන්ට ක්ෂේත්‍ර කටයුතු සඳහා උපයෝගී කර ගැනීම පිණිස අවශ්‍ය වන ශ්‍රමික පරීක්ෂණ වාර්තා, මාසික දින පොත් ආදී පොදු ආකෘති පත්‍ර මුද්‍රණය කර ලබා දීම ආදී මුද්‍රණ කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

2.10.1.1 දිස්ත්‍රික් /උප කම්කරු කාර්යාල අධීක්ෂණය

මේ සඳහා 2018 සහ 2019 වර්ෂයන් හිදී සකස් කරන ලද ක්‍රමවේදය 2020 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ප්‍රධාන වශයෙන් පහත අංශ යටතේ දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාලයන්හි ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

01. කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සහ අධිකරණ කටයුතු
02. හිඟ සේවක අර්ථසාධක අරමුදල් අය කර ගැනීමේ ක්‍රියාවලිය සහ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු
03. දෙපාර්තමේන්තුව වෙත ලැබෙන කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංගනය වීම පිළිබඳ පැමිණිලි කාර්යක්ෂමව විසඳීමේ කටයුතු
04. කාර්යාලයන්හි පරිපාලන කටයුතු

ඒ අනුව, ඉහත අංශ යටතේ ප්‍රගතිය මැනීම සඳහා 2020 වර්ෂයේ දී ලඟා විය යුතු ඉලක්ක සකස් කරන ලද අතර එම ඉලක්ක ළඟා කර ගත යුතු ආකාරය සහ ඉලක්ක කරා ළඟා විය යුතු කාලය පිළිබඳව කලාප භාර සියළුම නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් කැඳවා උපදෙස් ලබා දෙන ලදී. එසේම, තම කලාපය තුළ ඇති සියළු දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාලයන් අදාළ ඉලක්කයන් කරා මෙහෙයවීමේ වගකීම කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් වෙත පවරන ලදී.
2020 වර්ෂය අග භාගය වන විට ළඟා කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

01.කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු

ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සැලසුම් කිරීම හා අනුමැතිය ලබා ගැනීම, ඒ සඳහා ආයතන තෝරා ගැනීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ආයතන හා එම ආයතන සහකාර කම්කරු කොමසාරිස් විසින් ලබා දීම, ක්ෂේත්‍ර පරීක්ෂණවල ගුණාත්මකභාවය වර්ග කිරීම, කම්කරු නිලධරයන් විසින් වාර්තා නියමිත දිනයන්ට ලබාදීම හා එම වාර්තාවල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ද අධීක්ෂණය කරන ලද අතර එහි ප්‍රගතිය පහත පරිදි වේ.

2016 සිට 2019 දක්වා වූ පසුගිය වර්ෂ හතර තුල සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව ක්‍රමිකව වැඩි වී ඇති නමුත් 2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රමික පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන් හි දී සම්පූර්ණයෙන් ම අත්හිටුවා තිබීම සහ

පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීම හේතුවෙන් 2020 වර්ෂයේ පරීක්ෂණ සංඛ්‍යාව පෙර වර්ෂයන්ට සාපේක්ෂව අඩු අගයක් ගෙන ඇත.



ප්‍රස්තාරය 2.6 - පසුගිය වර්ෂ පහ තුළ සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව

නමුත්, කම්කරු නිලධාරීන් විසින් ලබා දී ඇති පරීක්ෂණ වාර්තාවන්හි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේදී, අධීක්ෂණ ක්‍රමවේදය ආරම්භ කළ 2018 වසරට සාපේක්ෂව 2020 වර්ෂයේ වාර්තාවන්හි ගුණාත්මක භාවයේ කැපී පෙනෙන වර්ධනයක් ඇත. ඒ අනුව, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු A සහ B වාර්තා 2.8 ප්‍රස්තාරය පරිදි 36% සිට 79% දක්වා සාධනීය ලෙස වර්ධනය වී ඇත.

2018 සිට 2020 දක්වා වූ වර්ෂයන්හි සිදු කරන ලද කම්කරු පරීක්ෂණයන් හි ගුණාත්මක භාවය සන්සන්දනාත්මකව



ප්‍රස්තාරය 2.7 - කම්කරු පරීක්ෂණයන් හි ගුණාත්මක භාවය - 2018, 2019 සහ 2020 වර්ෂ

02. හිඟ සේවක අර්ථසාධක අරමුදල් අය කර ගැනීමේ ක්‍රියාවලිය සහ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු

හිඟ සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීමට නිවේදන යොමු කිරීමට ගතවන කාල සීමා සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ පද්ධතිය ආශ්‍රයෙන් ලබාගෙන විශ්ලේෂණය කිරීමෙන් එක් එක් නිලධාරියා හා කාර්යාලය මට්ටමෙන්, ප්‍රමාදයන්ට හේතු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සඳහා පියවර ගන්නා ලදී. එසේම, හිඟ ගණනය කිරීම් සිදුකර ඇතත් මෙතෙක් නිවේදන යොමුකර නොමැතිවීමට හේතු පරීක්ෂා කර එම හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

එසේම, ප්‍රතිලාභ ගෙවීම සඳහා භාරගෙන ඇති ගොනු ප්‍රමාණය සහ ඊට ගතවී ඇති කාලය මාසිකව විශ්ලේෂණය කර කඩිනමින් ප්‍රතිලාභ ගෙවීමට නොහැකි වීමට හේතු හඳුනාගෙන, කාර්යක්ෂම ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලියක් ඇති කිරීමට ද කටයුතු කරන ලදී.



ප්‍රස්තාරය 2.8 - සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම සඳහා ගතවූ කාලය - 2017, 2018, 2019 සහ 2020 වර්ෂ

ඒ අනුව, 2017 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය අවසාන වන විට දින 07 ක් තුළ ප්‍රතිලාභ ගෙවූ ප්‍රතිශතය 21% සිට 47% දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ප්‍රතිලාභ ගෙවීමේ කාර්යක්ෂමතාවය වර්ධනය වී ඇත.

04. පෙත්සම් කටයුතු

ඒ ඒ දිස්ත්‍රික් හා උප කාර්යාල වෙත ලැබී ඇති පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය සහ විසඳීමේ කටයුතු ප්‍රමාද වී ඇති ගොනු ප්‍රමාණයන් හඳුනාගෙන ඒවා සඳහා වහාම පියවර ගැනීම සඳහා අදාළ උපදෙස් හා නිර්දේශ ලබා දෙන ලදී.

එසේම, සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන් හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා කලාප මට්ටමින් නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් විසින් සිය කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. එසේම, ප්‍රාදේශීය කම්කරු කාර්යාල භාර නිලධාරීන්ගේ 2020 වර්ෂයේ පළමු ප්‍රගති සමාලෝචන රැස්වීම Slack වැඩසටහන භාවිතයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එසේම, ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ද රැස්වීමක් පවත්වා දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.

2.10.2.මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත තම කාර්යභාරය පිළිබඳව පවත්නා දැනුම හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමට ඇති අවබෝධය වර්ධනය කරමින් දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම උදෙසා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය අත්‍යවශ්‍ය ක්‍රියාකාරකමක් වේ . ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් පුහුණුව ලබා දීමේදී නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව අදාළ පුහුණුව ලබා දීම මඟින් ද බාහිර අධ්‍යාපන ආයතන විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගී වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම මඟින් මෙන්ම විදේශ පුහුණුවීම් සඳහා යොමු කිරීමට අවස්ථා ලද විට ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා සම්බන්ධීකරණය සිදු කිරීම මගින් ද මෙම පුහුණු කාර්යයන් සිදු කරනු ලැබේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව ඉදිරි දෙවසර සඳහා දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2020 වර්ෂයේදී කෙටුම්පත් කරන ලද අතර ඒ අනුව ඉදිරි දෙවසර තුල පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

2020 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

අ.අ.	වැඩසටහන	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව
1	නවක සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන	02	97
2	සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු වැඩසටහන්	02	68
3	බේරුම්කරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන	01	78
4	ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වූ Online පුහුණු වැඩසටහන්	02	40
	එකතුව	**07**	**283**

වගුව 2.11 දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් 2020

අ.අ.	වැඩසටහන	ප්‍රතිපාදන ලබා දුන් නිලධාරීන් සංඛ්‍යාව
1	පශ්චාත් උපාධි	12
2	සහතික පත්‍ර පාඨමාලා සහ වැඩමුළු	10
	එකතුව	**22**

වගුව 2.12 බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් වෙත ප්‍රතිපාදන ලබා දීම - 2020

වැය ශීර්ෂය	2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු)	2020.12.31 දිනට වියදම (රු)	2020.12.31 දිනට ශේෂය (රු)	වියදම ප්‍රතිපාදනයන්ගේ ප්‍රතිශතයක් ලෙස %
221-01-01-2401	100,000.00	92,725.00	7,956.00	92.73%
221-02-02-2401	200,000.00	200,000.00	0.00	100.00%
221-02-03-2401	200,000.00	200,000.00	0.00	100.00%
221-02-04-2401	500,000.00	492,394.00	7,606.00	98.48%
එකතුව	**1,000,000.00**	**985,119.00**	**15,562.00**	**98.51%**

වගුව 2.13 - ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2020.12.31 දිනට සමස්ත වියදම - 2020

2.11. සංඛ්‍යාලේඛන කටයුතු

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාලව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ කම්කරු කොමසාරිස්ගේ අධීක්ෂණය යටතේ ඇති සංඛ්‍යාලේඛන අංශය විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2020 වර්ෂයේදී පහත කාර්යයන් සිදු කරන ලදී.

2.10.3.1 කම්කරු සංඛ්‍යාති 2018 (වාර්ෂික වාර්තාව) සකස් කර දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන කමිටු අනුමැතියට ඉදිරිපත් කිරීම

2.10.3.2 කම්කරු සංඛ්‍යාති 2019 (වාර්ෂික වාර්තාව) වගු සකස් කර අවසන් කිරීම

2.10.3.3 වැඩකල පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය 2020 සඳහා අදාල ආයතන වෙත උපලේඛන තැපැල් කර තොරතුරු රැස්කිරීම

2.10.3.4 සේවක සඟරාව සඳහා අවශ්‍ය දත්ත ලබා දීම

2.10.3.5 සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම සඳහා නිර්මාණය කර ඇති දත්ත පද්ධතිය වෙත දත්ත ඇතුලත් කිරීම

2.10.3.6 අදාල කාල සීමාවන් සඳහා පඩිපාලක සහා අනුව මාසිකව වැටුප් දර්ශකාංක සකස් කර එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම

2.10.3.7 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රමිතීන්ට යටත්ව ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ ප්‍රධාන දර්ශකාංක (Key Indicators of Labour Market - KILM) 14ක් සකස් කර ඉදිරිපත් කිරීම

2.10.3.සුනිසි මෙහෙවර වැඩසටහන

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සාමාජික රටක් වන ශ්‍රී ලංකාව එම සංවිධානයේ මූලික ප්‍රතිපත්තිවලට ගරු කරමින් එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ මූලික සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට දායක වී සිටී. එමෙන්ම ලක් රජය කාර්මික සාමය සහ ජාතික ඵලදායීතාව මෙරට ආර්ථික සමාජ අභිවෘද්ධිය සඳහා අත්‍යාවශ්‍ය සාධක ලෙස සලකනු ලැබේ. ඒ අනුව, යහපත් රැකියා ප්‍රවර්ධනය කරමින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව සහ මානව ගරුත්වය යන තත්ත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය.

සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රධාන ස්ථම්භයන් 4 කි.

i. රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායීතාව
ii. වැඩබිමෙහි හිමිකම
iii. සමාජ ආරක්ෂණය
iv. සමාජ කතිකාව

සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. 1,500,000.00 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත 2020 වර්ෂයේදී වෙන් කරන ලද අතර පහත සඳහන් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපෘතිය සිදු කල අංශය	ශුද්ධ ප්‍රතිපාදනය (රු.)	වියදම (රු.)	වියදම් ප්‍රතිශතය(%)
මානව සම්පත් සංවර්ධන අංශය	700,000.00	529,305.80	75.62%
කාන්තා හා ළමා කටයුතු අංශය	500,000.00 *	456,979.00	91.39%
මුළු එකතුව	1,200,000.00	986,284.80	65.75%

වගුව 2. 14 සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය - 2020

***සටහන - කාන්තා හා ළමා කටයුතු අංශය වෙත වෙන් කර තිබූ රු.800,000.00 ක ප්‍රතිපාදනයන්ගෙන් රු. 300,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අමාත්‍යාංශය විසින් නැවත ලබා ගෙන ඇත.**

2.12. සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම

සේවාලාභීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දීම අරමුණු කර ගනිමින් තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවාවන් ලබාදීමේ පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුව දැඩි අවධානය යොමු කර ඇත. මේ වන විට දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලේ අධීක්ෂණ පද්ධතිය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ පරිගණක දත්ත පද්ධතිය සමඟ සම්බන්ධ කර ක්‍රියාත්මකව පවතී.

එසේම, දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා ස්ලැක් යෙදවුම (Slack Application) 2020 වර්ෂයේදී හඳුන්වා දෙන ලද අතර මෙමගින් අභ්‍යන්තර සන්නිවේදන කටයුතු ක්ෂණිකව හා කඩදාසි භාවිතය අවම කරමින් සිදු කිරීමට හැකියාව ලැබී අතර නිළධාරීන් විසින් නිවසේ සිට රාජකාරි ඉටු කරන අවස්ථාවන් හිදී එම කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කිරීමට ද හැකියාව ලැබී ඇත.

මේ හැරුණු කොට මහජනතාවට සේවා ලබා ගැනීමට අවශ්‍ය අයදුම්පත්, ආකෘති හා කම්කරු අණ පනත්, සේවා යෝජකයින් විසින් අවධානය යොමු කළ යුතු පඩි පාලක සභා තීරණ ආදී අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, 2020 වසරේදී වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා පහත පරිදි වේ.

අ.අ.	යෙදවුම	සේවාව	ඉලක්කගත කණ්ඩායම
01	දෙපාර්තමේන්තු වෙබ් අඩවිය	බාගත කරගැනීමට හැකිවන පරිදි තොරතුරු පල කිරීම ▪ සියළු ආකෘති පත්‍ර (ආරක්ෂක සේවා සඳහා නිෂ්කාශන සහතිකය ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය ආදී) ▪ සංඛ්‍යාලේඛන තොරතුරු (කම්කරු සංඛ්‍යාති, වාර්ෂික රැකී රක්ෂා සමීක්ෂණය, වාර්ෂික වාර්තා, Covid 19 සමීක්ෂණ වාර්තාව - මැයි 2020 ආදී)	අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන්
02	දෙපාර්තමේන්තු වෙබ් අඩවිය	වෙබ් අඩවියෙහි ඇතුලත් කර පවතින තොරතුරු යාවත්කාලීන කිරීම ▪ ප්‍රධාන කාර්යාලයේ අංශ මඟින් සපයන සේවා ▪ සියළු කම්කරු කාර්යාලයන්හි ඇමතුම් තොරතුරු	අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන්
03	දෙපාර්තමේන්තු වෙබ් අඩවිය	තොරතුරු පල කිරීම ▪ මාධ්‍ය නිවේදන ▪ විදේශ ශිෂ්‍යත්ව ▪ ලංසු කැඳවීම් ▪ පුහුණු වැඩසටහන්	අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන්

		▪ බඳවාගැනීමේ පරිපාටි ▪ කම්කරු අණපනත් හා අති විශේෂ ගැසට් පත්‍ර ▪ දෙපාර්තමේන්තු චක්‍රලේඛ ▪ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල ▪ සක්‍රීය වෘත්තීය සමිති ලේඛනය ▪ කර්මාන්තශාලා ආඥාපනත යටතේ බලයලත් පුද්ගලයන් ලෙස පොදුවේ ක්‍රියාත්මක වන කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ඒ වෙනුවෙන් නිකුත් කරන ලද සහතිකය දරණ පුද්ගලයින්ගේ ලැයිස්තුව	
04	දෙපාර්තමේන්තු වෙබ් අඩවිය	කාර්ය මණ්ඩල දැන්වීම් පල කිරීම ▪ විවෘත හා සීමිත විභාග තොරතුරු හා ප්‍රතිඵල ▪ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දැන්වීම් සහ අයදුම් පත්‍ර ▪ ස්ථාන මාරුවීම් තොරතුරු	දෙපාර්තමේන්තු නිලධාරීන්
05	දෙපාර්තමේන්තු වෙබ් අඩවිය	සේවක අර්ථ සාධක අරමුදලේ සජීවි ප්‍රතිලාභ ගෙවීමට අදාලව අයදුම්පත්‍ර භාරදීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ වේලාවක් වෙන්කර ගැනීමට අවස්ථාව ලබා දීම	අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන්
06	දෙපාර්තමේන්තු වෙබ් අඩවිය	කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබාගැනීමේ අයදුම් පත්‍රය මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කිරීමට අවස්ථාව ලබා දීම	අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන්
07	Slack යෙදවුම	Covid-19 තත්ත්වය නිසා නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීමේදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පණිවිඩ හුවමාරු මාධ්‍යයක් ලෙසින් Slack යෙදවුම භාවිතා කිරීම	දෙපාර්තමේන්තු නිලධාරීන්
08	Meet වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම	Covid - 19 තත්ත්වය හේතුවෙන් නිලධාරීන් නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය සාකච්ඡාමය කටයුතු සඳහා පහසුකම් සැලසීම. (වර්ෂය තුලදී වීඩියෝ සම්මන්ත්‍රණ 15 ක් සිදු කර ඇත)	දෙපාර්තමේන්තු නිලධාරීන්
09	දෙපාර්තමේන්තු නිල YouTube චැනලය	දෙපාර්තමේන්තු නිල Youtube චැනලයෙහි කම්කරු දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන කම්කරු නීති හා අණ පනත් පිළිබඳව, දෙපාර්තමේන්තුව සපයනු ලබන සේවාවන් පිළිබඳව, එම සේවාවන් ලබා ගත හැකි කාර්යාල, අවශ්‍ය ලිපි ලේඛන Download කිරීමට අදාල Link, අදාල ලේඛන නිවැරදිව සම්පූර්ණ කිරීමට අදාල උපදෙස්, කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිතව පිහිටුවා ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පිළිබඳව දැනුවත් කෙරෙන වීඩියෝ 18 ක් අන්තර්ගත කර ඇත.	අභ්‍යන්තර හා බාහිර සේවා ලාභීන්

වගුව 2.15 - වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2020

2.13. අභ්‍යන්තර විගණනය

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින් ද සිය සියලු ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුව විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් පරිදි සිදු කල යුතු වේ. ඒ අනුව එම කටයුතු සම්පත්වල ඉහල උපයෝගිතාවයක් සහිතව මනා විනිවිදභාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේ ද යන්න අධීක්ෂණය කම්කරු කොමසාරිස් ජනරාල් ගේ ඍජු අධීක්ෂණය යටතේ සිදු වේ. ඒ අනුව, 2020 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- 2020 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් වර්ෂයට අදාලව සකස් කරන ලද විගණන සැලැස්ම අනුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ අංශ ද ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන පරීක්ෂණ 07 ක් සිදු කරන ලදී.
- රජයේ විගණන අංශය මගින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාල පරික්ෂා කර නිකුත්කර තිබූ විගණන විමසුම් 12 ක් සඳහා පිළිතුරු සපයන ලදී.
- වර්ෂය තුල කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ රැස්වීම් 03 ක් පවත්වන ලදී.

2.14 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

2.14.1. විශේෂ ජයග්‍රහණ

ගෝලීය ප්‍රවණතාවයන් ද සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාව තුළ යහපත් සේවා පරිසරයක් ඇති කිරීම උදෙසා ක්‍රියා කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ කාලීන වගකීමකි. ඒ අනුව, වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් පවතින අණ පනත්, නීති රීති වර්තමාන සේවා පරිසරයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම ට දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය තුළ දී සිදු කරන ලද පහත කාර්යයන් සුවිශේෂී වේ.

I. කම්කරු පරීක්ෂණ වාර්තා ආකෘතිය සංශෝධනය

තම ක්ෂේත්‍ර පරීක්ෂණ විස්තර වාර්තා කිරීම පිණිස කම්කරු නිලධාරීන් වර්තමානයේ දී භාවිතා කරනු ලබන කම්කරු පරික්ෂණ ආකෘතිය සරළ කිරීම පිණිස ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එය 2021 වර්ෂයේ සිට ක්ෂේත්‍ර කටයුතු වලදී භාවිතා කිරීමට අපේක්ෂිතය. ප්‍රතිපත්ති සම්පාදනය සහ තීරණ ගැනීම සඳහා වැදගත් වන බැවින් මෙම නව ආකෘතිය මගින් ආයතන පිළිබඳව වැඩිමනක් තොරතුරු ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

II. කම්කරු නීති උල්ලංඝනය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දෙන ලදී

කම්කරු නීති උල්ලංඝනය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත ආකෘතියක් හඳුන්වා දී ඇති අතර එය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් බාගත කර ගැනීමේ පහසුකම ද සලසා ඇත.

III. කම්කරු ආරවුල් විසඳීමේදී සම්මත මෙහෙයුම් පරිපාටියක් (Standard Operating Procedure) සකස් කරන ලදී.

සියලු කම්කරු කාර්යාලයන්හි කම්කරු ආරවුල් විසඳීමේ කටයුතු ඒකාබද්ධ කිරීම සහ නිරාකරණ ක්‍රියාදාමය කඩිනම් කිරීම පිණිස කම්කරු ආරවුල් විසඳීමේ දී සම්මත මෙහෙයුම් පරිපාටියක් සකස් කරන ලද අතර එය 2021 වර්ෂයේ සිට භාවිතයට ගැනීමට අපේක්ෂිතය.

IV. දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා සේ.අ.අ. හිමිකම් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ පහසුකම සලසන ලදී

කම්කරු කාර්යාලයන්ට පැමිණීමෙන් තොරව දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා සේ.අ.අ. හිමිකම් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ අවස්ථාව සේවකයන්ට ලබාදෙන ලදී.

V. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවා පිළිබඳව මහජනතාව අතර දැනුවත් බව ඉහළ නංවනු පිණිස යූ ටියුබ් නාලිකාවක් දියත් කරන ලද අතර එය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ

දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවා පිළිබඳව මහජනතාව අතර දැනුවත් බව ඉහළ නංවනු පිණිස කෙටි විඩියෝ දර්ශන රාශියක් ඇතුලත් යූ ටියුබ් නාලිකාවක් දියත් කරන ලදී.

VI. දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාල අධීක්ෂණය කිරිම

සියලු දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාල වෙත නිශ්චිත කාලසීමාවක් තුළ ළඟා කර ගත යුතු ඉලක්ක ලබා දුන් අතර ඒවායේ ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස,

- කම්කරු පරීක්ෂණවල ගුණාත්මක බව ඉහළ නැංවීම
- සේ.අ.අ. හිඟ මුදල් කාර්යක්ෂමව ගණනය කිරීම
- සේ.අ.අ. හිමිකම් ගෙවීමේ දින ගණනේ සාමාන්‍යය අඩුවීම සිදුවිය

VII. පහත දැක්වෙන පනත් හා ආඥා පනත් යටතේ නෛතික ලේඛන සකස් කිරීමේ බලය දෙපාර්තමේන්තුවේ කලාප කම්කරු කාර්යාල වෙත විමධ්‍යගත කරන ලදී.

- 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත
- 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
- 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත
- 2016 අංක 03 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත
- 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත

VIII. ළමයින් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන පනත් 05ක කෙටුම්පත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

IX. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ සහයෝගීතාවයෙන් "ශ්‍රී ලංකාවේ යහපත් සමාජ ආර්ථික ප්‍රතිසාධනය - එ.ජා. බහුපාර්ශව භාරකාර අරමුදල් ව්‍යාපෘතිය" (Healthy and Social Economic recovery of Sri Lanka - UN Multipartner Trust Fund Project)) ආරම්භ කරනු ලැබීය

X. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ සහයෝගීතාවයෙන්, ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය පිටුදැකීමේ අරමුණින් "කළමනාකරණය, දැනුවත් කිරීම සහ ප්‍රතිපත්ති මැදිහත්වීම පිළිබඳ ව්‍යාපෘතිය" (Management, Awareness and Policy Engagement (MAP 16) project) දියත් කරන ලදී

XI. කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ කාර්මික සංහිඳියාව ඉහළ නැංවීම පිණිස ගනු ලැබූ ක්‍රියාමාර්ග

අ. කොවිඩ් - 19 වසංගතය පැතිරීම හේතුවෙන් සේවය අවසන් කිරීම පිළිබඳ පැමිණිලි ලබා ගැනීම සහ ඒවා කාර්යක්ෂමව හා ඵලදායීව නිරාකරණය කිරීම පිණිස යාන්ත්‍රණයක් ස්ථාපිත කර තිබේ.

ආ. රාත්‍රි වැඩ මුරයන්හි කාන්තාවන් සේවයේ යෙදවීම සඳහා අනුමතිය ලබාදීම විධිමත් කරනු ලැබූ අතර රාත්‍රී වැඩ මුර සඳහා වන සිය ඉල්ලීම් මාර්ගගතව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සේවායෝජකයන්ට අවස්ථාව සලසා දෙන ලදී. මෙමඟින් රාත්‍රී වැඩ මුර සඳහා අනුමැතිය දීමේ ක්‍රමවේදය වඩා කාර්යක්ෂම සහ නම්‍යශීලී කර තිබේ.

ඇ. කිසිදු අධිභාරයක් හෝ ප්‍රමාද ගාස්තුවක් ගෙවීමකින් තොරව සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම පිණිස සේවා යෝජකයන්ට මාස හයක සහන කාලයක් ලබා දී තිබේ.

ඈ. පූර්වයෙන් ලබා දී ඇති රාත්‍රී අනුමැතීන් සඳහා 2020 ඔක්තෝබර් මස අවසානය දක්වා කාලානුගත අනුමතියක් ලබා දී තිබේ. මෙමඟින් කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ කාන්තාවන් රාත්‍රීයේ සේවයේ යෙදවීම පිණිස ඇති බාධක අවම කර තිබේ.

ඉ. කොවිඩ් - 19 වසංගත කාල සීමාව තුළ ගර්භණී හෝ මව් කිරි ලබා දෙන කාන්තාවන් සේවයේ යෙදවීමේදී අනුගමනය කළ යුතු නිර්දේශිත මාර්ගෝපදේශ පුද්ගලික අංශයේ ආයතන වෙත නිකුත් කර තිබේ. මෙමඟින් කාන්තා සේවිකාවන්ට ආරක්ෂාව සැපයීම සිදු කර ඇති අතර කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ ආර්ථික වශයෙන් වඩා සක්‍රීය වීමට ඔවුන් දිරිමත් කර තිබේ.

ඊ. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා වාර්තාමය වැඩසටහනක් ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීමට කටයුතු කරන ලදී.

උ. ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ කෙරෙහි කොවිඩ් - 19 බලපෑම සම්බන්ධයෙන් පුද්ගලික අංශයේ ආයතනයන් හි විද්‍යුත් සමීක්ෂණයක් (E - Survey) සිදු කරන ලදී.

2020 අප්‍රේල් සහ මැයි කාල සීමාව තුළ කම්කරු දෙපාර්තමේන්තුව විසින් "කොවිඩ්- 19 සහ ඉන් ඔබ්බට - ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ කෙරෙහි බලපෑම" නමින් විද්‍යුත් සමීක්ෂණයක් පවත්වනු ලැබීය. මෙම සමීක්ෂණයේ අරමුණ වූයේ කොවිඩ් - 19 හේතුවෙන් බලපෑමට ලක්වූ පෞද්ගලික අංශයේ ආයතන පිළිබඳ තොරතුරු රැස්කිරීම වන අතර එම තොරතුරු රජය විසින් සඵල,

ඉලක්කගත සහ මනාව සැලසුම් කළ ප්‍රතිපත්ති ප්‍රතිචාර සැපයීමට යොදා ගනු ඇත. විධිමත් පුද්ගලික අංශයේ ආයතන 2,764 ක් විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ සමීක්ෂණයට ප්‍රතිචාර දක්වනු ලැබීය.

සේවායෝජකයන්ගේ මූල්‍ය ගැටළු සඳහා සහන සැලසීම පිණිස වන සමීක්ෂණයේ කෙටි කාලීන නිර්දේශ පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

- වඩා අඩු පොළී අනුපාතයකට ව්‍යාපාර වෙත කාරක ප්‍රාග්ධනය සැපයීම පිණිස ණය ප්‍රදානය කිරීම අඛණ්ඩව සිදු කිරීම
- වෘත්තීය සමිති හෝ අදාළ පාර්ශවයන්ගේ අනුමැතිය ඇතිව ඉදිරියේදී ‘වැඩ නොමැතිව අහිමි වූ, වැටුප් ගෙවූ පැය ගණනින්’ කොටසක් නැවත අයකර ගැනීමට සේවා යෝජකයන්ට ඉඩ සැලසීම.
- වැඩ නොමැතිවීම / කෙටි කාලීන සේවා වියුක්ති උපායමාර්ග හේතුවෙන් නිවසේ රැදී සිටීමට සිදුව ඇති පිරිස් සඳහා අඩු කරන ලද වැටුප් සහිතව සේවා නියුක්තිය රඳවා ගැනීම. එමගින් ඔවුන්ගේ සේවය අවසන් කිරීම වෙනුවට වැටුපෙන් යම් ප්‍රතිශතයක් ගෙවීම සහිතව මාස හයක් කාලසීමාවක් තුළ සේවය සඳහා පූර්ණ කාලීන තනතුර වෙත නැවත පැමිණීම සහතික කරනු ඇත. සමාජ ආරක්ෂණය තහවුරු කරමින් මෙම කාලසීමාව තුළ සේ.අ.අ සහ සේ.නි.භා.අ. දායක මුදල් අඛණ්ඩව ගෙවනු ඇත.
- ව්‍යාපාරික අවස්ථා අහිමිවීම / සමාජ දූරස්ථභාවය පවත්වාගැනීමේ අවශ්‍යතා හේතුවෙන් සේවකයකු වඩා අඩු පැය ගණනක් වැඩ කරන්නේ නම්, එක් එක් සේවකයා විසින් වැඩකරනු ලබන පැය ගණන අනුව අනුපාතික පදනමින් ගෙවීම් සිදු කිරීමට ආයතනවලට ඉඩ දීම.
- කම්කරු සබඳතා ක්ෂේත්‍රයේ හඳුන්වාදුන් නව පනත් හෝ සංශෝධන / නෛතික විධිවිධාන පිළිබඳ අවශ්‍ය තොරතුරු / නිරීක්ෂණ ලබාදීම.

2.14.2. අභියෝග

- කොවිඩ් - 19 වසංගත කාලසීමාව තුළ එදිනෙදා කාර්යාල කටයුතු සීමා කිරිමට සිදුවිය. එසේම කම්කරු පරීක්ෂණ සහ කර්මාන්ත ශාලා පරීක්ෂණ ද තාවකාලිකව සීමා කිරිමට සිදු වූ අතර එය දෙපාර්තමේන්තුවේ සෑම ක්‍රියාකාරකමක් කෙරෙහිම නිශේධණාත්මකව බලපාන ලදී.
- දෙපාර්තමේන්තුව සතු සීමිත මූල්‍ය හා මානව සම්පත් උපයෝගී කර ගනිමින් දෙපාර්තමේන්තු දැක්ම සාක්ෂාත් කර ගැනීම.
- පවතින කම්කරු අණ පනත් වර්තමාන සීග්‍රයෙන් වෙනස්වන සමාජ ආර්ථික පරිසරයට යෝග්‍ය වන අයුරින් යාවත්කාලීන කිරීම සහ සංකීර්ණතා ඉවත් කර සරළ බවට පත් කිරීම.
- සේවක අර්ථසාධක අරමුදලෙහි ආවරණය පුළුල් කිරීම.
- කාලීන අවශ්‍යතාවයක් වන වෘත්තීය සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව පිළිබඳ තිරසාර සංස්කෘතියක් (Sustainable Occupational Safety and Health Culture) සියලු සේවා ස්ථානයන්හි ඇති කිරීම.
- කොවිඩ් වසංගත කාල සීමාව ආශ්‍රිතව පැන නැගුණු ගැටලු සඳහා පිළියම් යෙදීම 19.

2.14.3. ඉදිරි ඉලක්ක

වත්මන් රජයේ ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රකාශනයේ කම්කරු දෙපාර්තමේන්තුව වෙත අදාල ක්‍රියාකාරකම් සහ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කයන් හි දෙපාර්තමේන්තුව වෙත අදාල ක්‍රියාකාරකම් යථාර්තයක් බවට පත් කිරීම උදෙසා කටයුතු කිරීම 2021 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතු ප්‍රධාන ඉලක්කයක් වේ. ඒ අනුව, පහත ක්‍රියාකාරකම් ප්‍රමුඛ වේ.

- දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණ කටයුතු
- මහජනතාවට පහසුවන පරිදි කම්කරු අණ පනත් ලිහිල් ආකාරයෙන් සකස් කිරීම
- අදාල සංශෝධන ද ඇතුලත් කර කම්කරු නීති සංග්‍රහය (Labour Code) නැවත සකස් කිරීම
- දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි විසඳීම සඳහා සකස් කර ඇති සම්මත මෙහෙයුම්කරණ ක්‍රියාවලිය (Standard Operating Procedure) ක්‍රියාත්මක කිරීම
- වර්තමානයේ දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ආකෘති පත්‍ර සහ වාර්තා අත්‍යවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව ලබා ගත හැකි වන පරිදි සංශෝධනය කිරීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සිදු කරන ව්‍යාපෘති සඳහා අදාල පරිදි සහය වීම
- ළමා ශ්‍රමය පිටු දැකීම වෙනුවෙන් කටයුතු කිරීම
- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා දිරි දීමනාවක් (Incentive) ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම
- දෙපාර්තමේන්තුවේ ප්‍රතිරූපය වර්ධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම
- 2020 අප්‍රේල් සහ මැයි කාල සීමාව තුළ කම්කරු දෙපාර්තමේන්තුව විසින් "කොවිඩ් 19 සහ ඉන් ඔබ්බට - ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ කෙරෙහි බලපෑම" නමින් සිදු කරන ලද විද්‍යුත් සමීක්ෂණයේ දෙවන අදියර සිදු කිරීම.

තෙවන පරිච්ඡේදය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්
රු.

අයවැය 2020		2020	2019	සටහන
	ආදායම් ලැබීම්			
-	ආදායම් බදු	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**	-	-	
	ආදායම් නොවන ලැබීම්			
-	භාණ්ඩාගාර අග්‍රිම	2,030,323,025	2,389,348,000	ඒසීඒ-3
-	තැන්පතු	1,873,175,455	2,484,111,832	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්	80,541,111	104,067,383	ඒසීඒ-5/5(ඒ)
-	වෙනත් ලැබීම්	845,788,211	730,944,376	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**	**4,829,827,803**	**5,708,471,591**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**	**4,829,827,803**	**5,708,471,591**	
	අඩුකළා : වියදම් **පුනරාවර්තන වියදම්**			
1,468,650,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	1,446,432,428	1,352,698,768	ඒසීඒ-2(ii)
558,550,025	අනෙකුත් භාණ්ඩ හා සේවා	471,503,483	425,161,532	ඒසීඒ-2(ii)

2,382,320	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	2,382,316	2,087,515	
22,167,655	පොළී ගෙවීම්	20,705,058	21,802,449	
-	වෙනත් පුනරාවර්තන වියදම්	-	-	
2,051,750,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**	**1,941,023,284**	**1,801,750,264**	
	මූලධන වියදම්			
42,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	37,054,504	41,965,155	
1,010,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	943,520,888	1,252,189,466	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	-	-	
1,000,000	හැකියා වර්ධනය	985,119	8,432,242	
-	වෙනත් මූලධන වියදම්	-	5,296,600	
1,053,800,000	**මුළු මූලධන වියදම් (ඉ)**	**981,560,511**	**1,307,883,463**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)	**1,889,676,410**	**2,579,784,812**	
	තැන්පතු ගෙවීම්	1,803,429,515	2,470,142,804	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්	86,246,895	109,642,008	ඒසිඒ-5/5(ඒ)
	මුළු වියදම් උ= (ඇ+ඉ+ඊ)	**4,812,260,205**	**5,689,418,539**	
	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය (ඈ-උ) ඌ =	**17,567,597**	**19,053,052**	

ඒසීඒ-8

3.2 2020.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

රු.

	සටහන	තතය 2020	2019
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	17,049,392,907	16,106,635,234
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	253,610,987	247,920,953
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**17,303,003,894**	**16,354,556,187**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		(609,215,148)	(545,159,242)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		17,049,392,907	16,106,635,234
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-

<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	862,826,135	793,080,195
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**17,303,003,894**	**16,354,556,187**

පිටු අංක 53 සිට 56 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වු ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 60හි ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2021.06.29

එම් පී ඩී යූ කේ මාපා පතිරණ
ලේකම්
කම්කරු අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියස"
නාරාහේන්පිට
කොළඹ - 05

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2021.06.29

නීතිඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

ප්‍රධාන ගණකාධිකාරී
නම :
දිනය : 2021.06.29

පී. ජෙයබාස්කර්
ප්‍රධාන ගණකාධිකාරී
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ - 05

3.3 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

	සත්‍ය 2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	854,602,392	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	731,044,647
අග්‍රිම ලැබීම්	2,030,298,025	2,389,348,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,884,900,417**	**3,120,392,647**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,916,265,110	1,798,873,369
සහනාධාර සහ මාරුකිරීම්	23,087,373	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	39,640,977	28,274,332
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,978,993,460	1,827,147,701
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	905,906,957	1,293,244,946
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	93,616,498	111,321,342
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	93,616,498	111,321,342
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	981,560,511	1,307,883,464
අත්තිකාරම් ගෙවීම්	87,708,884	110,651,852
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	1,069,269,395	1,418,535,316
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(975,652,897)	(1,307,213,974)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(69,745,940)	(13,969,028)

<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	1,873,175,788	2,484,093,602
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**1,873,175,788**	**2,484,093,602**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	1,803,429,848	2,470,124,574
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**1,803,429,848**	**2,470,124,574**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**69,745,940**	**13,969,028**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)= (ඇ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>පිළියෙල කිරීමේ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්තන	2,051,750,000	2,051,750,000	1,941,023,284	95%
මූලධන	1,053,800,000	1,053,800,000	981,560,511	93%

3.7 මූ.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව		ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
01.	මැතිවරණ කොමිෂන් සභාව	020-1-1-0-1409	මැතිවරණ රාජකාරී වියදම් දැරීම සඳහා	493,515.00	493,515.00	493,515.00	100%
02.	මැතිවරණ කොමිෂන් සභාව	020-1-1-4-1409	මැතිවරණ රාජකාරී වියදම් දැරීම සඳහා	3,444,564.00	10,272,787.00	10,272,787.00	100%
03.	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය	054-1-1-0-1403	අමාත්‍යාංශයේ ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම.	250,000.00	250,000.00	250,000.00	100%
04.	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය	054-1-2-0-1403	අමාත්‍යාංශයේ ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම.	963,467.00	963,467.00	963,467.00	100%
05.	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය	054-1-2-2-2509	සුනිසි මෙහෙවර වැඩසටහන වෙනුවෙන් වියදම් දැරීම.	38,600.00	1,416,170.00	324,344.00	23%
06.	ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචිකිරීම් හා පුනරුත්තාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය	104-1-2-0-1003	උපාධිධාරී පුහුණු නිලධාරීන්ගේ දීමනා ගෙවීම.	940,000.00	8,140,000.00	7,200,669.28	88%
07.	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	130-1-14-0-1003	උපාධිධාරී පුහුණු නිලධාරීන්ගේ දීමනා ගෙවීම.	3,600,000.00	3,600,000.00	3,465,096.73	96%
08.	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය	193-1-1-0-1403	අමාත්‍යාංශයේ ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම	492,353.72	492,353.72	492,353.72	100%

09.	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය	193-1-1-0-1409	මෙහෙවර පියෙස පහසුකම් කළමනාකරණ ගාස්තු	1,571,489.97	1,571,489.97	1,571,489.97	100%
10.	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය	193-1-2-0-1403	අමාත්‍යාංශයේ ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම.	8,932,195.29	8,932,195.29	8,932,195.29	100%
11.	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය	193-1-2-2-2509	සුනිසි මෙහෙවර වැඩසටහන වෙනුවෙන් වියදම් දැරීම.	1,500,000.00	1,500,000.00	651,540.80	43%
12.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	253-1-2-4-1502	විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂ පවරා ගැනීම.	140,319.35	5,023,518.52	5,023,518.52	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,387,088,800.00	1,387,088,800.00		100%
9152	යන්ත්‍රෝපකරණ	617,880,905.30	617,880,905.30		100%
9153	ඉඩම්	2,262,720,000.00	2,262,720,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		-
9160	කෙරීගෙන යන වැඩ	12,781,703,198.91	12,781,703,198.91		100%
9180	බදු දෙන ලද වත්කම්	-	-		-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

(11)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LEW/A/DOL/2/2020/7 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 ජූලි 27 දින

කම්කරු කොමසාරිස් ජනරාල්,

කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කම්කරු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 තැන්පත් ලැබීම් හා ගෙවීම්

කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව එදිනට පොදු තැන්පත් ගිණුම් 02 හි ශේෂවල එකතුව රු.862,826,135 ක් වී තිබුණි. එයින් රු.267,767,361 ක් අවුරුදු 2 - 5 අතර ද, රු.104,571,143 ක් අවුරුදු 5 - 8 අතර ද රු.33,035,976 ක් අවුරුදු 8 – 10 අතර ද වූ කාල පරාසයන් තුළ නිරවුල් නොකර පැවතුණි. ඒ අනුව කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

1.6.1.2 අත්තිකාරම් ගිණුම්

2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ප්‍රකාශය හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සැසඳීමේදී, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.857,773ක් අඩුවෙන්ද, අත්තිකාරම් ගෙවීම් රු.693,030 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

1.6.2 අක්මුදල් ගැලපුම් ගිණුම

අක්මුදල් ගැලපුම් ගිණුමේ අඩුකිරීම් යටතේ දක්වා තිබූ අත්තිකාරම් 'බී' ගිණුමේ වෙනස රු.11,592,029 ක් වුවද, නිවැරදිව ශේෂ ගැලපුම් කල පසු එම වෙනස රු.11,448,604 ක් වූයෙන් රු.143,425 ක් වැඩියෙන් ගැලපුම් ගිණුමෙන් අඩුකර දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ප්‍රකාශය අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 253,446,194 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ එය රු.253 610,987 ක් ලෙස රු.164,793 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, එම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ගණනය කිරීමේදී සැලකිල්ලට ගැනීම නිසා ශුද්ධ වත්කම්වල අගය රු.164,793 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA 6) දක්වා තිබූ පරිදි වර්ෂය තුළදී මිලදී ගැනීම් මගින් අත්පත් කරගත් දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.943,495,888 ක් විය. කෙසේ වුවද, වැඩසටහන් අනුව සාරාංශ කරන ලද වියදම් ප්‍රකාශ (ACA-2(i)) අනුව එම වියදම රු.943,520,888 ක් විය. ඒ අනුව (ACA-2(i) ප්‍රකාශය පදනම් කරගත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ද දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.25,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුම අනුව, 2020 වර්ෂය තුල දී , වැය විෂය අංක 221-1-2-2104 හා 221-2-4-2104 මෙහෙවර පියස කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම, හා 221-1-1-2104, ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා වූ වියදම රු.940,730,168 ක් විය. එසේ වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ නොනිමි වැඩ යටතේ දක්වා තිබූ එම වටිනාකම රු.931,870,210 ක් විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ නොනිමි වැඩවල වටිනාකම රු.8,859,958 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළදී වැය විෂය අංක 221-1-1-2103 සහ 221-2-3-2103 යටතේ යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ අත්පත් කර ගැනීම්වල වටිනාකම රු.1,296,347 ක් විය.එසේ වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුල යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ අත්පත් කර ගැනීම් වටිනාකම රු.9,936,879 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව ශේෂ පිරික්සුමේ දක්වන ලද වියදමට වඩා රු. 8,640,532 ක් යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ අත්පත් කර ගැනීම් ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.4.1 ආදායම් නොවන ලැබීම්

2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව ආදායම් නොවන ලැබීම්වල එකතුව රු.845,791,843 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව වර්ෂය තුළ ලද ආදායම් නොවන ලැබීම් රු.854,602,392 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම්වල වටිනාකම රු.8,810,549 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

ඉකුත් වර්ෂය අවසානයේදී, භාණ්ඩාගාරයට පියවිය යුතු වූ රු.8,810,549 ක ශේෂය පියවීම සඳහා මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් ලැබී තිබූ මුදල, පොදු තැන්පත් ගිණුම මගින් නිරවුල්කර තිබියදී, නැවත වෙනත් ආදායම් ලැබීම් යටතේ දැක්වීම මේ සඳහා හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමණාකරණය

2.1.1 වැය විෂයන්හි ඉතිරිවීම්

(අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 20 කට අදාල ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.43,200,000 න් රු.16,274,745 ක් ඉතිරි කර තිබුණි. ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 37.6 ක් වූ අතර එය එක් එක් වැය විෂයයන්ගේ ප්‍රතිපාදනයෙන් සියයට 22 සිට සියයට 100 දක්වා පරාසයක විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වැය විෂයයන් 05 කට අදාල ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.12,050,000 න් රු.3,940,647 ක් ඉතිරි කර තිබුණි. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 ක් වූ අතර එය එක් එක් වැය විෂයයන්ගේ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 67 දක්වා පරාසයක විය.

2.1.2 වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

වැය විෂය අංක 221-2-4-1-1404 බදු කුලී හා පලාත් පාලන ආයතන බදු සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.65,300,000 ක් වුවද, වර්ෂය තුල වැය කර තිබුණේ සියයට 49 ක් එනම්, රු.31,990,490 ක් පමණි.ඒ අනුව ඉතිරිය සියයට 51 ක් හෙවත් රු.33,269,461 ක් වී තිබුණි. මෙ අනුව ඇස්තමේන්තු සකස් කිරීමේදී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 50 අනුව නිසි පුරෝකථනයක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර ප්‍රකාශයෙහි (SA-92) ඇතුළත් කර තිබූ, රු.83,004,986 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) රු.2,969,199 ක් වූ බැරකම් ගිණුම් ප්‍රකාශවල සටහන් වී තිබුණද භාණ්ඩාගාර ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර තිබූ, වැය විෂය අංක 221-1-1-0-1201 හා 221-1-1-0-1202 යටතේ දක්වා තිබූ රු.61,954 ක් වූ බැරකම්, බැරකම් ලේඛණයට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ශීර්ෂය - 221 කම්කරු දෙපාර්තමේන්තුවේ (ව්‍යාපෘතිය 04) මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 6 ට අදාල බැරකම් වටිනාකම රු.2,368,236 ක් වුවද, 2021 මාර්තු 31 දක්වා වැය ලෙජරය පරීක්ෂා කිරීමේදී පෙර වර්ෂයේ බැරකම් වෙනුවෙන් රු.2,967,746 ක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2021 මාර්තු 31 දක්වා පෙර වර්ෂයේ බැරකම් වෙනුවෙන් රු.643,485 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඉ) සේවක අර්ථ සාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන හා සැසඳීමේදී වැය විෂය අංක 221-2-4-1-1301, 221-2-4-1-1404 හා 221-2-2-4-1-1409 යටතේ දැක්විය යුතු රු.6,637,421 ක බැරකම් ගිණුම් ප්‍රකාශවල දක්වා නොතිබුණි.

(ඊ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හි 05 වගන්තියට අනුව භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අරමුණින් හෝ වැඩ කොන්ත්‍රාත් ඉටු කරවා ගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන් සමඟ එළඹෙන ලද භාණ්ඩ හා සේවා හා වැඩ සම්බන්ධ ගිවිසුම්වල වටිනාකම බැඳීම් ලෙස නිර්වචනය කර තිබේ. ඒ අනුව කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේදී මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ එළඹ තිබූ ගිවිසුමට අනුව වන බැඳීම 2021 වර්ෂය වන විටත් අවසන්ව නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ඉතිරිව තිබූ බැඳීම් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

තවද, 2020 වර්ෂය තුළදී මෙහෙවර පියෙස කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය විෂය අංක 221-1-1-2104 යටතේ රු.704,900,000 ක ප්‍රතිපාදනය කර තිබුණද

එයින් රු.66,598,182 ක් ඉතිරිව තිබුණි. එම ඉතිරියට හේතුව අවසාන බිල්පත ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් නොවීම බව දක්වා තිබුණද, මෙම ගෙවීමට නියමිත බැරකම පිළිබඳ බැරකම් ප්‍රකාශයේ සටහනක් මගින් හෝ හෙළිදරව් කර නොතිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදනයන්

(අ) 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දිනට සමාලෝචනය කර නොතිබූ අතර වර්ෂය තුළදී ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් රු.20,618,992 ක් වැය කර තිබුණි.

(ආ) 2020 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම මගින් රු.450,000 ක් වැය කර පුටු 30 ක් පමණක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද වර්ෂය තුළදී පුටු 786 ක් මිලදී ගෙන තිබුණි.කෙසේ වුවද 2021 ජුනි 30 දින දක්වා එයින් පුටු 494 ක් භාවිතයට ගෙන නොතිබුණි.

තවද විගණනය වෙත ඉදිරිපත් කර තිබූ පුටු මිලදී ගැනීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළත් නොවූ රු.354,400 ක් වටිනා විධායක පුටු (Executive high back chair) 20 ක් ද මිලදී ගෙන තිබුණි.

3.1.1 කොන්ත්‍රාත් පරීක්ෂාව

(අ) මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 12 වන මහලේ සිට 16 වන මහල දක්වා බෙදුම් ඇදි සවිකිරීම සඳහා වූ රු.135,300,000 ක් වූ පිරිවැය ඇස්තමේන්තුව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර නොතිබූ අතර මෙම කාර්යය සිදුකර ගැනීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණද, පිරිවිතර සකස් කිරීම, ලංසු කැඳවීම හා තාක්ෂණික කමිටු නිර්දේශ ලබාගැනීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සකස් කරන ලද ඇස්තමේන්තු මුදල මත එම දෙපාර්තමේන්තුවටම කොන්ත්‍රාත් කාර්යය ඉටු කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි.

තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i)ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවක් සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවිය හැක්කේ මුළු වටිනාකමින් සියයට 20 ක් පමණක් වුවත් ඊට පටහැනිව මුළු ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.135,300,000 සම්පූර්ණයෙන්ම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, 2021 මාර්තු මාසය වන විටත් කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) යම්කිසි කාර්යයක් ඉටුකිරීමේදී ඇස්තමේන්තුගත මුදලින් අත්තිකාරමක් ලබාදීම හෝ ඉටුකල වැඩ කොටස් වෙනුවෙන් මුදල් ගෙවීම කලයුතු වුවත් බොහෝ අවස්ථාවලදී කාර්යය ආරම්භ කිරීමට පෙර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මුළු ඇස්තමේන්තුගත පිරිවැයම ගෙවීම් කර තිබුණි. 2020 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් 31 දක්වා ඉදිකිරීම් කාර්යයන් 08 ක් වෙනුවෙන් කාර්යයන් ආරම්භයේදීම මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.120,239,994 ක් ලබාදී තිබුණි.

(ඇ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපත් කල 2020 දෙසැම්බර් 23 දිනැති තොරතුරු පරිදි හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කර ඇති 2021 මාර්තු 31 දිනට අදාල තොරතුරු පරිදි කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් හා වැඩිදියුනු කිරීමේ කාර්යයන් 25 ක් සඳහා වර්ෂ 2013 සිට 2020 කාලපරිච්ඡේදය තුලදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර ඇති මුදල රු.320,106,499 ක් වේ. 2021 මාර්තු 31 දින වන විට එම කාර්යයන්ගේ භෞතික ප්‍රගතිය සියයට 90 ත් සියයට 100 ත් අතර පැවති අතර ලබාදී තිබූ මුදල්වලින් රු.41,519,249 ක් එනම් සියයට 13 ක් ඉතිරිව පැවතුණි.එම ඉතිරි මුදල් නැවත ලබාගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

3.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) සියෙරා ජොයින්ට් වෙන්චර් (Sierra joint venture (pvt) Ltd) සමඟ 2013 ඔක්තෝම්බර් 03 එළඹ තිබූ ගිවිසුමට අනුව මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු මාස 36 කින් සම්පූර්ණ කිරීමට එකඟ වී තිබූ නමුත් 2019 ජූනි 26 දිනැති අංක අමප/19/1638/101/046-1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට යටත්ව 2019 ජූනි 30 දක්වා කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර තිබුණි. එසේ වුවද 2020 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන්ව නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව අයකල යුතු ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.මිලියන 7,891 ක් වූ මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 39.3 ක් එනම් රු.3,099,921,236 ක් මුල් අනුමත ඇස්තමේන්තුවෙන් අත්හල වැඩ (Omissions) වූ අතර සියයට 39.6 ක් එනම් රු.3,136,654,194 ක් එකතු කල අතිරේක වැඩ (Additions) ලෙස 46 වන ගෙවීම් සහතිකයට (payment certificate) ඇතුලත් කර තිබුණි. ඒ අනුව කෙනෝත්‍රාත්තුව පැවරීමේදී අනුමත කර තිබූ මුල් ඇස්තමේන්තුව සියයට 40 කින් පමණ වෙනස් වී තිබෙන බව නිරීක්ෂණය විය. මෙම අයිතමයන් හඳුනාගැනීමට අවශ්‍ය සැසඳීම් වාර්තා (comparisons sheet) විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අන්තර් ගෙවීම් සහතික (IPC) 13 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.21,772,797 ක මුදලක් (VAT බදු ඇතුලත්ව) 2020 දෙසැම්බර් 31 දින සියෙරා ජොයින්ට් වෙන්චර් (Sierra joint venture) ආයතනයට ගෙවා තිබුණි. මෙම මුදලින් රු.8,837,002 ක් ගෙවීම සඳහා 2017 දෙසැම්බර් 29 හා 2018 සැප්තැම්බර් 21 දිනැති ලිපි මගින්ද, රු.11,324,990 ක් ගෙවීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනදීද ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාදී තිබුණි. එසේ ප්‍රමාද ගාස්තු ගෙවීමට හේතු වූ කරුණු විගණනයට අනාවරණය නොවුනි.

3.2 වත්කම් පරීක්ෂාව

(අ) කම්කරු දෙපාර්තමේන්තුව සතු කම්කරු කාර්යාල පැවති ගොඩනැගිලි 03 ක් එම කාර්යාල නව ගොඩනැගිලිවලට ගෙන යාම නිසා වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක සිට නිශ්කාර්යව පැවතුණි.

(ආ) කම්කරු දෙපාර්තමේන්තුව සතු මතුගම, මහියංගණය, හම්බන්තොට හා කිලිනොච්චිය යන දිස්ත්‍රික් කාර්යාල 4 හි හා කුරුණෑගල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාලයේ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
(i)	ජ්‍යෙෂ්ඨ මට්ටම	210	136	74
(ii)	තෘතියික මට්ටම	668	495	173
(iii)	ද්විතියික මට්ටම	1,758	1,488	270
(iv)	ප්‍රාථමික මට්ටම	489	438	51
(v)	වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම)	13	13	0
එකතුව		**3,138**	**2,570**	**568**

මේ අනුව 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 3138 ක් වුවත් තථ්‍ය සේවක සංඛ්‍යාව 2570 ක් වූයෙන් පුරප්පාඩු 568 ක් පැවතුණි. කෙසේ වුවද කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ පිළිතුර අනුව, 2021.04.30 දිනට තතා සේවක සංඛ්‍යාව 2,651 ක් බවද එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 487 ක් බවද දක්වා තිබුණි.

ටී.ජී.අයි.පද්මිණි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

සිව්වන පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
වර්ෂය තුල සිදු කල සමස්ත කම්කරු පරීක්ෂණයන්ගෙන් ගුණාත්මකභාවයෙන් ඉහළ (A සහ B) කම්කරු පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතය		79%	
ඉලක්කගත කම්කරු පරීක්ෂණ සංඛ්‍යාවෙන් සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතය			57% *
ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලිවලින් පරීක්ෂණ සිදු කර අවසන් සංඛ්‍යාවේ ප්‍රතිශතය		79%	
සමාජ කතිකාව උදෙසා පවත්වන ලද වැඩසහන් සංඛ්‍යාව ඉලක්කයෙහි ප්‍රතිශතයක් ලෙස	70%		
සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ දින 14 ක් තුළ ගෙවීම් ප්‍රතිශතය			68%
සමස්ත කාර්ය මණ්ඩලයෙන් පුහුණුව ලැබූ සංඛ්‍යාවෙහි ප්‍රතිශතය	12% **		
දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද සමස්ත ප්‍රතිපාදනයෙන් උපයෝජනය කරන ලද ප්‍රතිශතය	94%		

*සටහන - වර්ෂය තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම වර්ෂයේ ඇතැම් මාසයන් හිදී සම්පූර්ණයෙන් ම නවතා තිබීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම සීමා කිරීමට සිදු වීම හේතුවෙන් ඉලක්කගත කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව සිදු කිරීම අපහසු විය.

**නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා කැඳවීමට නොහැකි වීම හේතුවෙන් සහ වර්ෂය තුළ ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ලබා දුන් අවම ප්‍රතිපාදන ප්‍රමාණය හේතුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රතිශතය වර්ෂය තුළ ඉලක්ක මට්ටම කරා ළඟා වීමට අපහසු වී ඇත.

පස්වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් අතරින්, කම්කරු දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව දෙපාර්තමේන්තුව වෙත ඍජුව අදාල වනුයේ 08 වන අභිමතාර්ථයයි. එනම්, **සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** යන අභිමතාර්ථය වේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර මෙම අභිමතාර්ථය හා සමපාත වන අතර දෙපාර්තමේන්තුවේ සියළු ක්‍රියාකාරකම්හි අවසාන නිමැවුම වනුයේ මෙම අභිමථාර්තය සාර්ථකව සාක්ෂාත් කර ගැනීම වේ. ඒ අනුව ගත් කල දෙපාර්තමේන්තුවේ සමස්ත ප්‍රගතිය මගින් 08 වන අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය විද්‍යමාන වේ.

මේ හැරුණු කොට 01 වන අභිමතාර්ථය වන සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම, 05 වන අභිමතාර්ථය වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සහ 16 වන අභිමතාර්ථය වන තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම යන අභිමතාර්ථ ද දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් අනුව අඩු වැඩි වශයෙන් අදාළ වේ.

ඉලක්කය / අරමුණ		ඉලක්ක		ජයග්‍රහණ දර්ශක		මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය
01	සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.1	2030 වන විට ලෝකයේ සියළුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරුව අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් අදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ.	1.1.1	ස්ත්‍රී පුරුෂභාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජනගහණයේ අනුපාතය	පෞද්ගලික අංශයේ සේවකයන්ගේ පැවති මාසික අවම වැටුප වන රු10,000.00ක මුදල රු. 2,500.00කින් වැඩි කිරීම සඳහා ජාතික අවම වේතන පනත සංශෝධනය කිරීමට අදාල කටයුතු සිදු කිරීම.
05	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	5.1	කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියළුම ස්ථායන්හි සිදුවන්නා වූ සියළුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම	5.1.1.	ස්ත්‍රී පුරුෂභාවයට අදාලව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න	2020 වර්ෂයේ කාන්තා දිනය නිමිති කොටගෙන පෞද්ගලික අංශයේ විවිධ ආයතනයන්හි සේවයේ නියුතු කාන්තා සේවිකාවන්ගේ ප්‍රසූත නිවාඩු ලබා දීම සහ මව් කිරි දීමේ විවේකය නිසි පරිදි ලබා දෙන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි සමූහ පරීක්ෂණ මාලාවක් පවත්වන ලදී, කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව කාන්තා හා ළමා කටයුතු අංශය වෙත ලැබුණු පැමිණිලි 23 ක් සම්බන්ධයෙන් කටයුතු අදාල කටයුතු කිරීම සහ පරීක්ෂණ 06 ක් අවසන් කිරීම, ආයතන 607 ක් ආවරණය වන පරිදි කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ සිදු කිරීම,
		5.2	මානව කූට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුලත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම	5.2.1	පසුගිය මාස 12 ක කාලය තුලදී, හිංසනයේ ස්වභාවය, සහ වයස අනුව, සහකරුවෙක් සිටි/සිටින, වයස අවුරුදු 15 ට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතරින් කායික, ලිංගික, හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය	
		5.6 .ඇ.	ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය සහ සියළුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම,	5.ඇ. 1	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය	

			ශක්තිමත් කිරීම සහ නීතිමය ලෙස බලාත්මක කිරීම			ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි විධායක කාර්ය මණ්ඩලය, කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ අවසන් වසර සිසුන්, කාන්තාවන්ට හා ළමයින්ට අදාල නීතිය පිළිබඳව දැනුවත් කිරීම් වැඩසටහන් 02 ක් සිදු කිරීම.
8	සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	8.5.	2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම	8.5.1	රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම	කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ.
				8.5.2	ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාලව විරැකියා අනුපාතය	
		8.7	බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම	8.7.1.	ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව	“නව අනතුරුදායක රැකියා රෙගුලාසිය" කෙටුම්පත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර එහි අවසාන කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ලැබී ඇත. ළමුන් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම සඳහා වන සංශෝධනය පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම් අවස්ථාවෙහි පවතී. ළමා ක්‍රියාකාරකම් වාර්තාව (Child Activity Survey – 2016) අනුව මෙරට ළමා ශ්‍රමය 1% ක් වන අතර එය ශුන්‍ය තත්ත්වයට

						ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව, අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ සඳහා ආයතන 290 ක් පරීක්ෂා කරන ලදී.
		8.8.	කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුළු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වුවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම	8.8.1.	ස්ත්‍රී පුරුෂ භාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන්	රැකියාව සම්බන්ධ මාරක හා මාරක නොවන අනතුරු අවම කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ. ඒ අනුව, අනතුරු සිදු විය හැකි අවස්ථා කර්මාන්තශාලා පරීක්ෂණ මගින් හඳුනා ගැනීම, කර්මාන්තශාලා සේව්‍ය සේවක පිරිස් දැනුවත් කිරීම, අනතුරු වළක්වා ගැනීමට දැනුවත් කල කර්මාන්තශාලා එසේ නොකිරීම පිළිබඳ සහ අනතුරු වාර්තා නොකිරීම පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමආදී කටයුතු සිදු කරන ලදී. එම ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ස්ත්‍රී පුරුෂ භාවය අනුව සහ සංක්‍රමණික තත්ත්වය අනුව වාර්තා තබා ගැනීමක් වර්තමානයේදී සිදු නොකරන අතර ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිතය. රැස්වීමේ හා කේවල් කිරීමේ නිදහස පවතින අතර, ඒ අනුව 2020.12.31 දිනට මෙරට ලියාපදිංචි වෘත්තීය සමිති සංඛ්‍යාව 1843 කි.
				8.8.2.	ස්ත්‍රී පුරුෂ භාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ලේඛන මුලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමුහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම	

16	තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්ති සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සැම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම	16.2	ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරා කෑමට, කූට්ටනයට සහ සියළුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම	16.2.3	වයස අවුරුදු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවුරුදු 18-29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ ප්‍රමාණය	"නව අනතුරුදායක රැකියා රෙගුලාසිය" කෙටුම්පත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර එහි අවසාන කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් ලැබී ඇත. ළමුන් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම සඳහා වන සංශෝධනය පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම් අවස්ථාවෙහි පවතී.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2020 වර්ෂයේදී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුල සිදු කිරීමට ඉලක්කගත ක්‍රියාකාරකම් බොහොමයක අදාල ඉලක්ක කරා ළඟා වීම අපහසු විය.

සයවන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1.සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස
ජ්‍යෙෂ්ඨ	210	136	74	35%
තෘතීයික	668	495	173	26%
ද්විතියික	1758	1488	270	15%
ප්‍රාථමික	489	438	51	10%
එකතුව	**3125**	**2557**	**568**	**18%**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරී පුරප්පාඩු ප්‍රතිශතය 35% ක් වන අතර තෘතීයික මට්ටමේ නිලධාරී පුරප්පාඩු ප්‍රතිශතය 26% කි. එම මට්ටම් දෙකම තීරණ ගැනීම සඳහා දායකත්වය ලබා දෙන නිළධරයන් වන බැවින් එම මට්ටම්හි පුරප්පාඩු ප්‍රමාණය ඉහළ ප්‍රතිශතයක් ගැනීම මගින් ආයතනික ධූරාවලිය තුළ තීරණ ගැනිම, වගකීම් භාර ගැනීම මෙන්ම අධීක්ෂණය සහ මඟපෙන්වීම වැනි අවස්ථාවලදී ප්‍රායෝගික ගැටළු රාශියක් උද්ගත වේ. එමගින් අනෙකුත් නිළධාරීන්ගේ රාජකාරී ඉටුකිරීමේ ඵලදායීතාවද අඩුවේ. එසේම, නිළධාරීන්ට තමාට නියමිත රාජකාරී වලට අමතරව අනෙකුත් පුරප්පාඩු තනතුරු වල රාජකාරි ඉටුකිරීමට සිදුවීමේදී ඔවුන්ට දැරීමට සිදුවන වැඩ ප්‍රමාණය අධික වීම තුළින් රාජකාරී ඉටුකිරීමේ ඵලදායීතාව අඩුවීම මෙන්ම ඔවුන් කායික හා මානසික විඩාවට ලක්වීමට ද ඉඩ ඇත.

එසේම, දෙපාර්තමේන්තුව විසින් කම්කරු ක්ෂේත්‍රයට අදාල අන පනත් 14 ක පමණ රාජකාරි කටයුතු දෛනිකව සිදු කරනු ලබන අතර සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම සම්බන්ධ කටයුතු, පැමිණිලි විමර්ශනය සම්බන්ධ කටයුතු ආදි රාජකාරි ද දෛනිකව සිදු කරනු ලැබේ. කළමනාකරණ සේවා නිලධාරීන්ගේ සේවයේ පවතින පුරප්පාඩු හේතුවෙන් මෙම කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම අපහසු වී ඇත.

සමස්තයක් ලෙස ගත් කල, ප්‍රමාණවත් නිළධාරි සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ දෛනික කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කිරීම අපහසුවී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තු නිළධාරීන් වෙත ලබා දෙන පුහුණු වැඩසටහන් තුළින් ඔවුන්ගේ වෘත්තීය දැනුම, හැකියාවන් සහ ආකල්ප වර්ධනය මෙන්ම ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ප්‍රවර්ධනය ප්‍රධාන වශයෙන් අරමුණු වේ. එසේම දෙපාර්තමේන්තුව සතු සීමිත ප්‍රතිපාදන සහ සම්පත් මනා ලෙස කළමනාකරණය කර ගනිමින් නවීන තාක්ෂණය තම රාජකාරී කටයුතු සඳහා භාවිතා කිරීමට නිළධාරින් පෙළඹවීම ද, මහජනතාවට වඩා සමීප සේවාවක් ලබාදීම සඳහා නිලධාරීන් ගේ ත්‍රෛභාෂා නිපුණතාවය වර්ධනය ද, දෙපාර්තමේන්තුව තුල ඵලදායී අන්තර සම්බන්ධතා ගොඩනැගීම ද මෙම පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, රාජ්‍ය සේවයේ අත්දැකීම් බහුල, කාර්යක්ෂම සහ තෘප්තිමත් නිළධාරි කණ්ඩායමක් බිහි කිරීම මෙම පුහුණු වැඩසටහන් මගින් සිදු කෙරේ.

2020 වර්ෂය තුළ දෙපාර්තමේන්තු නිලධාරීන් ගේ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය පහත පරිදි වේ.

දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

අ.අ.	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs.’ 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
		තනතුර	සේවක සංඛ්‍යාව		දේශීය	විදේශීය		
සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් පවත්වන ලද වැඩසටහන්								
1	නවක සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන	සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිළධාරීන්	97	දින 05	103,800.00		දේශීය	නවක නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීම
2	ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් බෙරුම්කරුවන් සඳහා පැවති වැඩමුළුව	බෙරුම්කරුවන්	78	දින 01	72,870.00		දේශීය	බෙරුම්කරුවන්ගේ භූමිකාව පිළිබඳව දැනුම වර්ධනය වීම.
බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා නිලධරයන් යොමු කිරීම්								
වැඩමුළු								
3	Access Control System වැඩමුළුව	තාක්ෂණ නිලධාරින්	01	දින 01	6,000.00		දේශීය	නිලධාරීන් ගේ දැනුම වර්ධනය වීම
4	රජයේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා අන්තර්ජාල සාක්ෂරතාව හා සමාජ මාධ්‍ය භාවිතය	පුස්තකාලයාධිප තිවරුන්	02	දින 01	4,000.00		දේශීය	නිලධාරීන් ගේ දැනුම වර්ධනය වීම
5	රාජ්‍ය නිලධාරීන් ගේ වැටුප් සකස් කිරීම	කළමනාකරණ සේවා නිළධාරීන්	02	දින 01	8,000.00		දේශීය	දෙපාර්තමේන්තු නිලධාරීන් ගේ වැටුප් පරිවර්තන නිවැරදිව සිදු කිරීම.
6	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිළධාරීන්	03	දින 03	30,000.00		දේශීය	විගණන විමසුම් සඳහා විධිමත් පරිදි පිළිතුරු යැවීමේ කටයුතු පිළිබඳව නිලධාරීන් ගේ දැනුම වර්ධනය වීම

අ.අ.	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs.' 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
		තනතුර	සේවක සංඛ්‍යාව		දේශීය	විදේශීය		
7	රාජ්‍ය සේවයේ බඳවාගැනීම් හා සම්බන්ධ රාජකාරි	කළමනාකරණ සේවා නිළධාරීන්	01	දින 02	8,000.00		දේශීය	බඳවාගැනීම් හා සම්බන්ධ රාජකාරි පිළිබඳව නිලධාරීන් ගේ දැනුම වර්ධනයවීම
8	ප්‍රසම්පාදන ක්‍රියාවලිය	කළමනාකරණ සේවා නිළධාරීන්	01	දින 02	8,000.00		දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව සිදුකිරීම පිළිබඳව නිලධාරීන් ගේ දැනුම වර්ධනය වීම
ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි සඳහා යොමු කිරීම්								
9	සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය	සහකාර කම්කරු කොමසාරිස්	01		102,500.00		දේශීය	නිලධාරීන් ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
10	නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය	නීති නිලධාරි	01		300,000.00		දේශීය	නිලධාරීන් ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
11	සංවර්ධන අධ්‍යයනය පශ්චාත් උපාධි පාඨමාලාව	සහකාර කම්කරු කොමසාරිස්	01		100,000.00		දේශීය	නිලධාරීන් ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
12	මානව සම්පත් කළමනාකරණය	සහකාර කම්කරු කොමසාරිස්	01		110,000.00		දේශීය	නිලධාරීන් ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
13	රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු/ සහකාර කම්කරු කොමසාරිස්වරු/	07		550,000.00		දේශීය	නිලධාරීන් ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම

අ.අ.	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs.' 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
		තනතුර	සේවක සංඛ්‍යාව		දේශීය	විදේශීය		
14	කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්	01		98,500.00		දේශීය	නිලධාරීන් ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන්								
15	සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පවත්වන ලද නිලධාරි පුහුණු වැඩසටහන්	සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් කටයුතු සිදු කරන දෙපාර්තමේන්තු නිලධාරීන්	68		42,975.00		දේශීය	නිලධාරීන් ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වූ වැඩසටහන්								
16	ආරවුල් නිරවුල් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන (Online)	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු/ සහකාර කම්කරු කොමසාරිස්වරු/ කම්කරු නිලධාරීන්	40	දින 10		ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය අනුග්‍රහය	දේශීය	ආරවුල් නිරවුල් කිරීම පිළිබඳ නිලධාරීන් ගේ දැනුම යාවත්කාලීන වීම
17	International Tripartite Meeting on Supporting Grass Roots Activities through the International Employers' and Workers' Network (SGRA)	කම්කරු කොමසාරිස් ජනරාල්	01	දින 03	40,275.00		විදේශීය (වියට්නාමය)	ජපාන රජය විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලබන මෙම SGRA ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අනෙකුත් රටවල් සමඟ අත්දැකීම් බෙදා ගැනීම.

වගුව 2.16 - දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2020 වර්ෂය

සත්වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ - ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම සාරාංශ (CIGAS) පිලියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA—N20)	අනුකූල වේ		

	යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
03	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම	අනුකූල වේ		
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	බොහෝ අවස්ථාවල අනුකූල වේ.	ඇතැම් අවස්ථාවන්හිදී අදාල කාර්යාල සහ අංශ වෙතින් පිළිතුරු කැඳවීමේදී නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම	නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීම පිළිබඳව අදාල කාර්යාල හා අංශ දැනුවත් කර ඇත.
6	අභ්‍යන්තර විගණනය			
6.1	මූ.රෙ 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණනය සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිලිබද තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සදහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සදහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබද තොරතුරු කොම්ප්ට්‍රෝල් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සදහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සදහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	දිස්ත්‍රික් සියල්ලම ආවරණය වන පරිදි පවතින කම්කරු	වසරකට දෙවතාවක් අපහරණ කමිටු පත් කර අපහරණ ක්‍රියාවලිය කඩිනම්

			කාර්යාලවල, යම් වාහනයක් ගර්හිත වී ඇති විට ඊට අදාල අපහරන ක්‍රියාවලිය සඳහා වන කමිටු පත් කර ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කල්ගතවීම.	කිරීමට කටයුතු කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවයේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි , බැරකම් වලට එලඹීම.	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			

12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබද කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ යම් ප්‍රමාණයක් නිරවුල් කර ඇති අතර තවදුරටත් නිරවුල් කල යුතු හිඟහිටි ණය ශේෂ පවතී.	
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිමය නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම	දෙපාර්තමේන්තුව සඳහා අදායම් ගිණුමක් නැත.		
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම	අදාල නැත		
15.2	රැස් කර තිබු ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නැත		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාල නැත		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය සඳහා පත් කර ඇති කමිටුව මගින් සියළු කාර්යාල සහ අංශ වලට අදාල තොරතුරු රැස් කර ඇති අතර අවසන් අදියරේ කටයුතු සිදු කරමින් පවතී.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි , පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම	අනුකූල නොවේ	පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය සඳහා පත් කර ඇති කමිටුව මගින්ම එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.	

19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්මෙහි මූලික කෙටුම්පත සකස් කර ඇත.	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සැලැස්මෙහි මූලික කෙටුම්පතෙහි අන්තර්ගත ඇත.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර අවසන් කිරීමෙන් අනතුරුව සිදු කිරීමට අපේක්ෂිතය	
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබද වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල නොවේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය.